සියලු ම හිමිකම් ඇවිරිණි/
முழுப் பதிப்புரிமையுடையது/
All Rights Reserved]

15881

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014 (2016)


පැ. තුනයි

## (02) ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ප්‍රවණතා

### විභාග අපේක්ෂකයින්ට උපදෙස්

**ඉතා වැදගත් :**

**පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකරන්න.**



✳ **පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට ඉලක්කම් ලියා නැති උත්තර පත්‍ර ඇගයීමට ලක් නොවේ.**
**1 2 3 4**

**ඔබේ විභාග අංකය මෙහි ඇති තිත් ඉර මත ලියන්න.**

....................................

නිවැරදි බවට නිරීක්ෂකගේ කෙටි අත්සන

....................................

**වැදගත් :**

✳ මෙම ප්‍රශ්න පත්‍රය I හා II කොටස්වලින් සමන්විත පිටු **06** කින් හා ප්‍රශ්න **40** කින් යුක්තවේ.

✳ පිළිතුරු ලිවීමට පෙර ප්‍රශ්න පත්‍රය පිටු අංක අනුව සකසා ගන්න.

✳ I කොටසේ ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේම ද II කොටසේ ප්‍රශ්න සියල්ලට ම සපයනු ලබන කඩදාසිවල ද පිළිතුරු සපයන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය පැය තුනකි.

✳ ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.

✳ දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.

✳ ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතුය.

✳ ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු හෝ පෑනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.

✳ අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු සහිත, මකන දියර භාවිත කරන ලද හා පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| පිටුව | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| 2 | 1 - 8 | |
| 3 | 9 - 18 | |
| 4 | 19 - 30 | |
| 5 | 31 - 33 | |
| 6 | 34 - 40 | |
| **එකතුව** | | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

[ 2 වැනි පිටුව බලන්න.

34. 2016 අයවැය යෝජනා මගින් මෙරට සෞඛ්‍ය සේවාව සඳහා දළ දේශීය නිෂ්පාදනයෙන් 3% ක පමණ ප්‍රතිශතයක් වෙන් කර තිබේ.

(i) නිරෝගිමත් සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහිකිරීම සඳහා වර්තමානයේ මෙරට සෞඛ්‍ය සේවාව මගින් ජයගත යුතු ප්‍රධානතම අභියෝග දෙක මොනවා ද?

(අ) ..........

(ආ) ..........

(ii) ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය, දකුණු ආසියාවේ වෙනත් රටවල්වලට සාපේක්ෂව ඉතා ඉහළ මට්ටමක පැවැතීමට හේතු දෙකක් සඳහන් කරන්න.

(අ) ..........

(ආ) ..........

(iii) ශ්‍රී ලංකාවට සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ ළඟා කරගත හැකි වූ සහස්‍ර සංවර්ධන ඉලක්ක දෙකක් දක්වන්න.

(අ) ..........

(ආ) ..........

35. වර්තමානයේ බොහෝ දේශපාලන විචාරකයෝ පාලනය පිළිබඳ සිව්වන ගාමක බලවේගය ලෙස ජනමාධ්‍ය හඳුන්වා දීමට පෙළඹී සිටිති.

(i) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් ස්ථාපිත කිරීමේදී ජනමාධ්‍යවලට පැවරෙන වගකීම් දෙකක් සඳහන් කරන්න.

(අ) ..........

(ආ) ..........

(ii) සමාජයීය හා දේශපාලන පැවැත්ම අභියෝගයට ලක් කිරීමේ ශක්‍යතාව, මුද්‍රිත ජනමාධ්‍යවලට වඩා විද්‍යුත් ජනමාධ්‍යවල ඉහළ මට්ටමක පැවැතීමට හේතුවන සාධක දෙකක් දක්වන්න.

(අ) ..........

(ආ) ..........

(iii) මෑතක දී රජය මගින් ඉදිරිපත් කළ තොරතුරු දැනගැනීම සඳහා වූ අයිතිවාසිකම් පනත මගින් ජනමාධ්‍ය කෙරෙහි ඇති විය හැකි බලපෑම් දෙකක් සඳහන් කරන්න.

(අ) ..........

(ආ) ..........

*(ලකුණු 06 × 5 = 30 යි)*

## II කොටස

- අංක **36** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි **පිළිතුර**, සපයනු ලබන කඩදාසිවල ලියන්න.

36. ශ්‍රී ලංකාවේ තාක්ෂණික සහ වෘත්තීය පුහුණු ක්ෂේත්‍රවල කඩිනම් සංවර්ධනය සඳහා රජයට ගත හැකි ක්‍රියාමාර්ග හතරක් විස්තර කරන්න. *(ලකුණු 08 යි)*

37. ශ්‍රී ලංකා ආර්ථිකයේ ශ්‍රම ඉල්ලුම හා සැපයුම අතර සමතුලිතතාවක් ඇති කරලීම සඳහා මෙරට අධ්‍යාපන පද්ධතිය තුළ ක්‍රියාත්මක කළ හැකි නවීකරණ ප්‍රයත්න හතරක් පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*

38. ශ්‍රී ලංකාවේ ශීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් උදෙසා රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාව තවදුරටත් ඉහළ නැංවීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග හතරක් හේතු සාධක සහිතව විස්තර කරන්න. *(ලකුණු 08 යි)*

39. මෙරටට විදේශීය ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීම කෙරෙහි ශ්‍රී ලංකා විදේශ ප්‍රතිපත්තියෙහි බලපෑම, ප්‍රධාන ලක්ෂණ හතරක් ඇසුරින් පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*

40. පරිසර සංරක්ෂණය සඳහා ශ්‍රී ලංකා රජය මගින් මෑතකදී ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘති හතරක් විවේචනාත්මකව අගයන්න. *(ලකුණු 08 යි)*

***

● අංක **31** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර, දී ඇති තිත් ඉරි මත කෙටියෙන් ලියන්න.

31. ශ්‍රී ලංකා රජය මගින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේ මූලික කටයුතු මේ වන විටත් ආරම්භ කොට තිබේ.

(i) නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය මගින් මෑතකදී ගන්නා ලද ප්‍රමුඛ ක්‍රියාමාර්ග දෙකක් දක්වන්න.

(අ) ..........

(ආ) ..........

(ii) නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේදී වැඩිවශයෙන් අවධාරණය කළ යුතු ප්‍රමුඛතම දේශපාලන හා සමාජයීය ක්ෂේත්‍ර දෙක මොනවා ද?

(අ) ..........

(ආ) ..........

(iii) ශ්‍රී ලංකා රජය මගින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සඳහා යොමුවීමට බලපෑ ප්‍රධාන හේතු දෙකක් සඳහන් කරන්න.

(අ) ..........

(ආ) ..........

32. වර්තමානයේ කාන්තාව ආර්ථික හා සමාජයීය වශයෙන් සවිබල ගැන්විය යුතු බවට සමාජ කතිකාවතක් ගොඩනැගෙමින් පවතී.

(i) කාන්තාව ආර්ථික හා සමාජයීය වශයෙන් සවිබල ගැන්වීම වර්තමානයේ වැදගත් වීමට ප්‍රධාන හේතු දෙකක් දක්වන්න.

(අ) ..........

(ආ) ..........

(ii) මේ වන විට රජය මගින් කාන්තාව ආර්ථික හා සමාජයීය වශයෙන් සවිබල ගැන්වීම සඳහා ගෙන ඇති පියවර දෙකක් සඳහන් කරන්න.

(අ) ..........

(ආ) ..........

(iii) කාන්තාව ආර්ථික හා සමාජයීය වශයෙන් සවිබල ගැන්වීමේ දී මුහුණදීමට සිදුවිය හැකි අභියෝග දෙකක් සඳහන් කරන්න.

(අ) ..........

(ආ) ..........

33. මෙරට සංවර්ධනයේ දී දේශපාලන ස්ථාවරභාවය මෙන්ම ජාතික සංහිඳියාව ද එක සේ වැදගත් වේ.

(i) ජාතික සංහිඳියාව ඇති කිරීමට වර්තමාන රජය විසින් ගනු ලැබූ සාධනීය පියවර දෙකක් දක්වන්න.

(අ) ..........

(ආ) ..........

(ii) ජාතික සංහිඳියාව ඇති කිරීමේ දී රජයට මුහුණදීමට සිදුවිය හැකි අභියෝග දෙකක් සඳහන් කරන්න.

(අ) ..........

(ආ) ..........

(iii) ජාතික සංහිඳියාව ගොඩනගා ගැනීම තුළින් අන්තර්ජාතික වශයෙන් මෙරටට අත්කරගත හැකි ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න.

(අ) ..........

(ආ) ..........

**I කොටස**

- අංක **1** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර මත** ලියන්න.

1. ශ්‍රී ලංකා සිවිල් සේවයට බඳවාගත් ප්‍රථම ශ්‍රී ලාංකිකයා වන්නේ මින් කවරෙක් ද?
   (1) පොන්නම්බලම් අරුණාචලම් මහතා (2) ටී.බී. ජයා මහතා
   (3) ඩී.බී. ජයතිලක මහතා (4) ඊ.ඩබ්ලිව්. පෙරේරා මහතා (.........)

2. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය යටතේ ස්ථාපිත කරන ලද පහත දැක්වෙන ස්වාධීන කොමිෂන් සභා අතුරින් පාර්ලිමේන්තුවට වගකිවයුතු **නොවන** කොමිෂන් සභාව කුමක් ද?
   (1) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව
   (2) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව
   (3) මැතිවරණ කොමිෂන් සභාව
   (4) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව (.........)

3. හතරවන පරම්පරාවේ (4G) අන්තර්ජාල පහසුකම්වලින් මුළු දිවයිනම ආවරණය කෙරෙන 'ගූගල් ලූන් (Google Loon)' ව්‍යාපෘතියේ ශ්‍රී ලාංකීය පාර්ශ්ව හවුල්කාර ආයතනය වන්නේ මින් කුමක් ද?
   (1) ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම
   (2) ශ්‍රී ලංකා විදුලි සංදේශන නියාමන කොමිසම
   (3) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සන්නිවේදන නියෝජිතායතනය
   (4) කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක හා තොරතුරු තාක්ෂණ පීඨය (.........)

4. 'මධ්‍යකාලීන සිංහල කලා (Medieval Sinhalese Art)' නමැති සුප්‍රසිද්ධ ග්‍රන්ථයේ කතුවරයා කවරෙක් ද?
   (1) මහාචාර්ය සෙනරත් පරණවිතාන
   (2) මහාචාර්ය ගුණපාල මලලසේකර
   (3) ආචාර්ය නන්දදේව විජේසේකර
   (4) ආචාර්ය ආනන්ද කුමාරස්වාමි (.........)

5. කොළඹ කොටස් වෙළෙඳපොළෙහි කාර්ය සාඵල්‍යය විශ්ලේෂණය සඳහා භාවිත කරනු ලබන දර්ශකයක් වන්නේ මින් කුමක් ද?
   (1) ජීවන වියදම් දර්ශකය (2) මිලංකා දර්ශකය
   (3) කොළඹ පාරිභෝගික මිල දර්ශකය (4) ඒක පුද්ගල ආදායම් දර්ශකය (.........)

6. වර්තමාන ශ්‍රී ලංකාවේ වැඩිම ජනගහනයක් සහිත පළාත් පහ අවරෝහණ අනුපිළිවෙළින් නිවැරදිව දක්වා ඇත්තේ පහත කවරක ද?
   (1) බස්නාහිර, මධ්‍යම, දකුණ, වයඹ, සබරගමුව
   (2) බස්නාහිර, දකුණ, සබරගමුව, වයඹ, මධ්‍යම
   (3) බස්නාහිර, දකුණ, වයඹ, සබරගමුව, මධ්‍යම
   (4) බස්නාහිර, මධ්‍යම, දකුණ, සබරගමුව, වයඹ (.........)

7. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) පාලනය වන්නේ මින් කුමන අමාත්‍යාංශය යටතේ ද?
   (1) උසස් අධ්‍යාපන හා මහාමාර්ග (2) නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු
   (3) තාක්ෂණ හා පර්යේෂණ (4) කම්කරු හා කම්කරු සබඳතා (.........)

8. අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කිරීම උදෙසා වත්මන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සලසා ඇති විධිවිධානයක් **නොවන්නේ** මින් කුමක් ද?
   (1) ජනාධිපතිවරයාගේ තනි අභිමතයට ඉහළ අධිකරණවල විනිසුරුවන් ඉවත් කළ නොහැකිවීම
   (2) අධිකරණ සේවා කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීම
   (3) විනිසුරුවන් සිය තනතුරේ සිට කරනු ලබන නිල කටයුතුවලට විරුද්ධව නඩු පැවරිය නොහැකිවීම
   (4) ඉහළ අධිකරණ විනිසුරුවන්ගේ වැටුප් ඒකාබද්ධ අරමුදලින් ගෙවීම (.........)

[ 3 වැනි පිටුව බලන්න.

9. ශ්‍රී ලංකාවට පැමිණි පළමු විදේශීය දේශාටකයා කවරෙක් ද?

(1) හියුං සාන් (2) මාර්කෝ පෝලෝ
(3) ඉබන් බතුතා (4) පාහියන් (.........)

10. උමාඔය ව්‍යාපෘතිය සඳහා ආධාර දෙනු ලබන විදේශීය රට කුමක් ද?

(1) ඉරානය (2) සෞදිඅරාබිය
(3) කුවේටය (4) ඕමානය (.........)

11. ශ්‍රී ලංකා මහබැංකුවේ පළමු ප්‍රාදේශීය කාර්යාලය විවෘත කරන ලද්දේ මින් කුමන නගරයේ ද?

(1) නුවරඑළිය (2) මාතර
(3) මාතලේ (4) යාපනය (.........)

12. ශ්‍රී ලාංකික පුරවැසියන් හට සර්වජන ඡන්ද බලය පළමුවරට ලබා දෙන ලද්දේ මින් කුමන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ ද?

(1) කෝල්බෲක් (2) මැනිං
(3) ඩොනමෝර් (4) සෝල්බරි (.........)

13. වර්තමානයේ ශ්‍රී ලංකාවේ උද්ධමනය මැනීමට භාවිත කෙරෙන කොළඹ පාරිභෝගික මිල දර්ශකය සඳහා පාදක කරගනු ලබන වසර මින් කුමක් ද?

(1) 2006 / 2007 (2) 2008 / 2009
(3) 2009 / 2010 (4) 2010 / 2011 (.........)

14. ශ්‍රී ලංකාව තුළ විදේශ විනිමය ගනුදෙනු පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නීත්‍යානුකූල අවසරය ලබා දී ඇත්තේ පහත කවරකට ද?

(1) බලපත්‍රලාභී මූල්‍ය සමාගම්
(2) සමූපකාර ග්‍රාමීය බැංකු
(3) බලපත්‍රලාභී වාණිජ බැංකු
(4) විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් (.........)

15. නොගැළපෙන යුගලය මින් කුමක් ද?

(1) ඩී.ජේ. විමලසුරේන්ද්‍ර - ජල විදුලිය
(2) ඩී.බී. රම්පාල - දුම්රිය ප්‍රවාහනය
(3) රැල්ෆ් දැරණියගල - ඉතිහාසය
(4) සර් නිකුලස් ආටිගල - වෛද්‍ය විද්‍යාව (.........)

16. 2016 වසරේ ආසියානු මලල ක්‍රීඩා තරගාවලියේ දී ශ්‍රී ලංකාව විසින් වැඩිම රන්පදක්කම් සංඛ්‍යාවක් දිනාගත් ක්‍රීඩා ක්ෂේත්‍රය කුමක් ද?

(1) බර ඉසිලීම (2) උස පැනීම
(3) පිහිනුම් (4) මැරතන් (.........)

17. ශ්‍රී ලංකාව තුළ භාවිතයට ගැනෙන පුනර්ජනනීය ප්‍රාථමික බලශක්ති උත්පාදන ප්‍රභවයක් නොවන්නේ මින් කුමක් ද?

(1) පොසිල ඉන්ධන (2) සූර්ය ශක්තිය
(3) ජෛව ස්කන්ධ (4) ජලයේ විභව ශක්තිය (.........)

18. ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට කාන්තාවක් කැබිනට් අමාත්‍ය ධූරයකට පත් කරන ලද්දේ කුමන වසරේ දී ද?

(1) 1952 (2) 1956 (3) 1960 (4) 1970 (.........)

[ 4 වැනි පිටුව බලන්න.

15881

19. අ.පො.ස.(උසස් පෙළ) විභාගය සඳහා මෑතකදී හඳුන්වාදුන් තාක්ෂණවේදය විෂය ධාරාව සාර්ථකව සමත්වන සිසුවකුට ලබාදීමට අපේක්ෂිත ඉහළම ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) මට්ටම කුමක් ද?

(1) පළමු (2) දෙවන
(3) තෙවන (4) සිව්වන (.........)

20. ශ්‍රී ලාංකීය සංස්කෘතියට ආහාරපාන, ඇඳුම් පැළඳුම්, සංගීත ක්‍රම, ගෘහභාණ්ඩ හා පුද්ගල නාම වැඩි වශයෙන්ම හඳුන්වා දෙන ලද්දේ මින් කුමන විදේශීය ජාතිකයන් විසින් ද?

(1) අරාබි (2) පෘතුගීසි (3) ලන්දේසි (4) බ්‍රිතාන්‍ය (.........)

*(ලකුණු 01 × 20 = 20 යි)*

● අංක **21** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර, දී ඇති තිත් ඉර මත ලියන්න.

21. එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර අධිකරණයේ උපසභාපතිවරයකු ලෙස කටයුතු කළ ශ්‍රී ලංකාවේ කීර්තිමත් නීතිවේදියා කවරෙක් ද?

.......................................................................................................................

22. ශ්‍රී ලංකාවේ ප්‍රථම බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය කුමක් ද?

.......................................................................................................................

23. වර්තමානයේ ශ්‍රී ලාංකික කාන්තාවකට නීත්‍යානුකූලව විවාහ විය හැකි අවම වයස අවුරුදු කීය ද?

.......................................................................................................................

24. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා ඩිප්ලෝමා, උපාධි හා පශ්චාත් උපාධි ප්‍රදානය කරනු ලබන විශ්ව විද්‍යාලයක් නොවන ආයතනය කුමක් ද?

.......................................................................................................................

25. 2015 වර්ෂයේ දී ශ්‍රී ලංකා මහබැංකුව මගින් ඇමෙරිකන් ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය වෙළෙඳපොළ ඉල්ලුම හා සැපයුම මත තීරණය වීමට ඉඩහරින ලද්දේ කුමන මාසයේ සිට ද?

.......................................................................................................................

26. ශ්‍රී ලංකා ජාතික නැනෝ තාක්ෂණික පර්යේෂණ ආයතනය පිහිටුවා ඇති ප්‍රදේශය කුමක් ද?

.......................................................................................................................

27. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය යටතේ ස්ථාපිත කරන ලද පළාත් සභාවක ප්‍රධාන අමාත්‍යවරයා ඇතුළුව අමාත්‍ය මණ්ඩලයේ සිටිය යුතු මුළු සාමාජික සංඛ්‍යාව කීය ද?

.......................................................................................................................

28. වර්තමානයේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ප්‍රමුඛතම සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන කුමක් ද?

.......................................................................................................................

29. මෑතකදී ශ්‍රී ලංකා රජය මගින් භාවිතය සීමා කරන ලද MSG නමින් හඳුන්වනු ලබන රසකාරකයේ විද්‍යාත්මක නාමය කුමක් ද?

.......................................................................................................................

30. සිංහරාජ වන රක්ෂිතය හැරුණුවිට, ශ්‍රී ලංකාවේ අනෙක් විශාලතම වන රක්ෂිතය පිහිටි දිස්ත්‍රික්කය කුමක් ද?

.......................................................................................................................

*(ලකුණු 01 × 10 = 10 යි)*

15881

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது ]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ
විවෘත තරග විභාගය - 2014 (2016)


**(03) ගෝලීය ප්‍රවණතා**

පැ තුනයි

**විභාග අපේක්ෂකයින්ට උපදෙස්**

ඉතා වැදගත් :

පිළිතුරු ලිවීම සඳහා පැන්සල
භාවිත නොකරන්න.



✳ පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට ඉලක්කම් ලියා නැති උත්තර පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

I 2 3 4

ඔබේ විභාග අංකය මෙහි ඇති
තිත් ඉර මත ලියන්න.

.....................................

නිවැරදි බවට නිරීක්ෂකගේ
කෙටි අත්සන

.....................................

**වැදගත් :**

✳ මෙම ප්‍රශ්න පත්‍රය I හා II කොටස්වලින් සමන්විත පිටු **06** කින් හා ප්‍රශ්න **40** කින් යුක්තවේ.

✳ පිළිතුරු ලිවීමට පෙර ප්‍රශ්න පත්‍රය පිටු අංක අනුව සකසා ගන්න.

✳ I කොටසේ ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේම ද II කොටසේ ප්‍රශ්න සියල්ලට ම සපයනු ලබන කඩදාසිවල ද පිළිතුරු සපයන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය පැය තුනකි.

✳ ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.

✳ දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.

✳ ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතුය.

✳ ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු හෝ පෑනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.

✳ අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු සහිත, මකන දියර භාවිත කරන ලද හා පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| පිටුව | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| 2 | 1 - 12 | |
| 3 | 13 - 25 | |
| 4 | 26 - 32 | |
| 5 | 33 - 35 | |
| 6 | 36 - 40 | |
| **එකතුව** | | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

[ 2 වැනි පිටුව බලන්න.

## II කොටස

- අංක **36** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර, සපයනු ලබන කඩදාසිවල ලියන්න.

36. වර්තමානයේ දී සාර්ක් සංවිධානයට අයත් රටවල් පොදුවේ මුහුණපාන දේශපාලනික හා ආර්ථික ගැටලු හතරක් විමසන්න. *(ලකුණු 08 යි)*

37. වත්මන් හි රටකට ජාතික ගීයක් පමණක්ම නොව මානව ප්‍රජාවට ලෝක ගීයක් ද අවශ්‍ය වී තිබේ. එවැනි ලෝක ගීයක අන්තර්ගත විය යුතු කරුණු හතරක් පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*

38. නූතන මිනිසා නිෂ්පාදන මෙන්ම පරිභෝජන යන්ත්‍රයක් බවට පත්ව තිබේ. මෙම තත්ත්වය අවම කිරීම සඳහා පිළියම් හතරක් පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*

39. ලෝකයේ සමහර ධනවත් රටවල් අභ්‍යවකාශ ගවේෂණය සඳහා අතිවිශාල ධනස්කන්ධයක් වියදම් කරයි. මෙම තත්ත්වයට පක්ෂව හෝ විපක්ෂව හෝ කරුණු හතරක් හේතු සාධක සහිතව විමසන්න. *(ලකුණු 08 යි)*

40. තොරතුරු සන්නිවේදන තාක්ෂණය තුළින් ආර්ථික, අධ්‍යාපනික, සෞඛ්‍ය සහ පාරිසරික සංවර්ධනය සඳහා ඉටු කළ හැකි කාර්යභාරය කරුණු හතරක් ඇසුරින් පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*

❋ ❋ ❋

33. ලෝක ශිෂ්ටාචාරය ආරම්භයේ සිටම යුද්ධ හටගෙන ඇත්තේ භෞමික අඛණ්ඩතාව (territorial integrity) මුල්කොට ගෙන යැයි සැලකේ.

(i) භෞමික අඛණ්ඩතාව නමැති සංකල්පය පැහැදිලි කෙරෙන නිර්වචන දෙකක් දක්වන්න.

(අ) ..............................................................................................

(ආ) ..............................................................................................

(ii) වර්තමානයේ භෞමික අඛණ්ඩතාව වෙනුවෙන් නිතර ගැටුම් ඇතිකර ගන්නා ආසියාතික රටවල් දෙකක් නම් කරන්න.

(අ) ..............................................................................................

(ආ) ..............................................................................................

(iii) අනාගතයේ දී භෞමික අඛණ්ඩතාව පිළිබඳ සංකල්පය තුරන්වී යාමට හේතු විය හැකි කරුණු දෙකක් දක්වන්න.

(අ) ..............................................................................................

(ආ) ..............................................................................................

34. ගෝලීය උණුසුම, මෙම ශතවර්ෂය තුළ මානවවර්ගයා මුහුණපාන බරපතලම අර්බුදය වේ.

(i) ගෝලීය උණුසුම කෙරෙහි බලපාන හේතු දෙකක් සඳහන් කරන්න.

(අ) ..............................................................................................

(ආ) ..............................................................................................

(ii) ගෝලීය උණුසුම නිසා හටගන්නා හානිකර ප්‍රතිඵල දෙකක් දක්වන්න.

(අ) ..............................................................................................

(ආ) ..............................................................................................

(iii) ගෝලීය උණුසුම අවම කිරීම සඳහා ජාත්‍යන්තර මට්ටමෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් දක්වන්න.

(අ) ..............................................................................................

(ආ) ..............................................................................................

35. 'මනුෂ්‍ය වර්ගයාට විද්‍යාව හා කලාව නිර්මාණය සඳහා ප්‍රඥාව තිබිණි. එහෙයින් ඔවුනට සාධාරණ වූත්, සහෝදරත්වයෙන් යුක්ත වූත්, සාමකාමී ලෝකයක් නිර්මාණය කළ නොහැකි ද?' - ලියෝන් බ්ලම්

(i) සාමකාමී ලෝකයක් නිර්මාණය කිරීමේ කර්තව්‍යයේ දී මානව වර්ගයාට මුහුණ දීමට සිදුවන අභියෝග දෙකක් සඳහන් කරන්න.

(අ) ..............................................................................................

(ආ) ..............................................................................................

(ii) කලාව හැදෑරීමෙන් චරිතගත කළ හැකි ගුණාංග දෙකක් දක්වන්න.

(අ) ..............................................................................................

(ආ) ..............................................................................................

(iii) අනාගතයේ දී වඩාත් මානුෂික ලෝකයක් බිහිකිරීම සඳහා යෝජනා දෙකක් ඉදිරිපත් කරන්න.

(අ) ..............................................................................................

(ආ) ..............................................................................................

*(ලකුණු 06 × 5 = 30 යි)*

[ 6 වැනි පිටුව බලන්න.

**I කොටස**

- අංක **1** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර මත** ලියන්න.

1. එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් හඳුන්වා දෙන ලද සහස්‍ර සංවර්ධන නිෂ්ඨාවල ආරම්භක වර්ෂය හා අවසාන වර්ෂය අනුපිළිවෙළින් මොනවා ද?
   (1) 2000, 2012 (2) 2000, 2013 (3) 2000, 2014 (4) 2000, 2015 (………)

2. මෑතක දී නිල් විප්ලවයක් (Blue Revolution) ආරම්භ කොට ඇති රට මින් කුමක් ද?
   (1) චීනය (2) ජපානය (3) ඉන්දියාව (4) දකුණු කොරියාව (………)

3. ජනගහනය ක්‍රමයෙන් අඩුවෙමින් පවත්නා ආසියාතික රට මින් කුමක් ද?
   (1) ජපානය (2) උතුරු කොරියාව (3) සිංගප්පූරුව (4) දකුණු කොරියාව (………)

4. වත්මන්හි ප්‍රථමවරට එක්සත් රාජධානියේ වාණිජමය වශයෙන් සාර්ථක ලෙස තේ වගාව ආරම්භකොට ඇත්තේ පහත කවරක ද?
   (1) අයර්ලන්තය (2) එංගලන්තය (3) ස්කොට්ලන්තය (4) වේල්සය (………)

5. පෘථිවියේ සිට සූර්යයාට ඇති සාමාන්‍ය දුර කිලෝමීටර කීය ද?
   (1) මිලියන 100 (2) මිලියන 150 (3) මිලියන 200 (4) මිලියන 250 (………)

6. රටවැසියන් ආදායම් බදු නොගෙවන රටවල් වැඩිම සංඛ්‍යාවක් දැක්වෙන්නේ පහත කවරක ද?
   (1) මොනාකො, බර්මියුඩා, එක්සත් අරාබි එමිරේට්, කුවේට්
   (2) මොනාකො, බර්මියුඩා, එක්සත් අරාබි එමිරේට්, ඊජිප්තුව
   (3) මොනාකො, බර්මියුඩා, එක්සත් අරාබි එමිරේට්, ඉන්දුනීසියාව
   (4) මොනාකො, බර්මියුඩා, කුවේට්, ඊජිප්තුව (………)

7. ජන වර්ග දෙකක් අතර හටගත් අරගල හේතුවෙන් වර්ෂ 1994 අප්‍රේල් මාසයේ දී අටලක්ෂයකට වඩා රටවැසියන් සමූල ඝාතනයට ලක්වූ රට මින් කුමක් ද?
   (1) රුවන්ඩාව (2) සුඩානය (3) ලිබියාව (4) නයිජීරියාව (………)

8. "සීමා රහිත බලය අසීමිත දූෂණයට හේතුවේ (Absolute power corrupts absolutely)" නමැති සුප්‍රකට ප්‍රකාශය කරන ලද්දේ කවරෙක් ද?
   (1) නෙල්සන් මැන්ඩෙලා (2) ඒබ්‍රහම් ලින්කන්
   (3) මහත්මා ගාන්ධි (4) ඇක්ටන් සාමි (………)

9. ලෝකයේ වැඩියෙන්ම කෝපි නිෂ්පාදනය කරනු ලබන රට මින් කුමක් ද?
   (1) ඉන්දියාව (2) මෙක්සිකෝව
   (3) ඝානාව (4) බ්‍රසීලය (………)

10. විද්‍යුත් තැපෑලේදී BCC නමැති සංක්ෂිප්තය යොදාගනු ලබන්නේ මින් කුමන යෙදුම සඳහා ද?
    (1) Blank Carbon Copy (2) Bulk Carbon Copy
    (3) Blind Carbon Copy (4) Back Carbon Copy (………)

11. ලෝකයේ සුපිරි ධනවතුන් වැඩිම සංඛ්‍යාවක් සිටින රට කුමක් ද?
    (1) ජපානය (2) ඇමෙරිකා එක්සත් ජනපදය
    (3) ජර්මනිය (4) චීනය (………)

12. වාර්ෂිකව ලෝක පරිසර දිනය පවත්වනු ලබන්නේ කවදා ද?
    (1) අප්‍රේල් 05 (2) මැයි 05 (3) ජුනි 05 (4) ජූලි 05 (………)

[ 3 වැනි පිටුව බලන්න.

13. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් ප්‍රකාශිත මානව සංවර්ධන දර්ශකයට අයත් සංරචකයක් නොවන්නේ මින් කුමක් ද?
    (1) ආයු අපේක්ෂණය (2) ආදායම
    (3) මානව අයිතිවාසිකම් (4) අධ්‍යාපනය (.........)

14. විද්‍යාත්මක ක්‍රමය (Scientific method) ලොවට හඳුන්වාදුන් විද්‍යාඥයා කවරෙක් ද?
    (1) නිකලස් කොපර්නිකස් (2) ගැලීලියෝ ගැලිලි
    (3) අයිසෙක් නිව්ටන් (4) ඇල්බට් අයින්ස්ටයින් (.........)

15. 'අබුසායිෆ් (Abu Sayyaif)' නමැති සටන්කාමී කණ්ඩායම අයත්වන රට කුමක් ද?
    (1) පිලිපීනය (2) ලෙබනනය (3) කොළොම්බියාව (4) ස්පාඤ්ඤය (.........)

16. 'යුද්ධ හටගන්නේ මිනිස් සිත් තුළ ය. එබැවින් සාම කඳවුරු බැඳිය යුත්තේ මිනිස් සිත්සතන් තුළය. (Wars begin in the minds of men and the defences of peace must be constructed in the minds of men)' මෙම පූර්විකාව සඳහන් වන එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනය කුමක් ද?
    (1) UNDP (2) UNESCO (3) UNICEF (4) UNHCR (.........)

17. ලෝක ප්‍රසිද්ධ Time සඟරාවට අනුව වර්ෂ 2015 දී වසරේ පුද්ගලයා (Person of the year 2015) වශයෙන් නම් කරන ලද්දේ මින් කවරෙක් ද?
    (1) ඩේවිඩ් කැමරන් (2) ව්ලැඩිමීර් පුටින් (3) ඇන්ජෙලා මර්කල් (4) නරේන්ද්‍ර මෝඩි (.........)

18. න්‍යෂ්ටික බලය නිෂ්පාදනය සඳහා අවශ්‍ය මූලද්‍රව්‍යය මින් කුමක් ද?
    (1) රේඩියම් (2) තෝරියම් (3) යුරේනියම් (4) ටයිටේනියම් (.........)

19. වර්තමානයේ යුරෝපා සංගමයෙන් ඉවත්වීමට අදහස් කරනු ලබන රට මින් කුමක් ද?
    (1) මහා බ්‍රිතාන්‍යය (2) ස්විට්සර්ලන්තය (3) බෙල්ජියම (4) ඩෙන්මාර්කය (.........)

20. නොගැළපෙන යුගලය මින් කුමක් ද?
    (1) ෂෙරිනා විලියම්ස් - ක්‍රීඩාව (2) ඩෙස්මන්ඩ් ටුටු - විද්‍යාව
    (3) අරුන්දතී රෝයි - සාහිත්‍යය (4) බලීඩා ෂියා - දේශපාලනය (.........)

*(ලකුණු 01 × 20 = 20 යි)*

● අංක **21** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි **පිළිතුර**, දී ඇති තිත් ඉර මත ලියන්න.

21. 'මිලිටරිය ප්‍රථමයෙන්' නමැති ප්‍රතිපත්තිය අනුගමනය කරනු ලබන ආසියාතික රට කුමක් ද?

..........................................................................................................................................

22. සාර්ක් කලාපීය විශ්වවිද්‍යාලය පිහිටුවා ඇති අගනුවර කුමක් ද?

..........................................................................................................................................

23. ඊශ්‍රායලයේ රාජ්‍ය භාෂාව කුමක් ද?

..........................................................................................................................................

24. පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් අතුරින් ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නොමැති රට කුමක් ද?

..........................................................................................................................................

25. වෛදික - උපනිෂද් සමයේ පැවති සාම්ප්‍රදායික ගුරුකුල ආශ්‍රම අනුව බිහිවූ නූතන ඉන්දියානු අධ්‍යාපන ආයතනය කුමක් ද?

..........................................................................................................................................

[ 4 වැනි පිටුව බලන්න.

26. චීන්හුවා ප්‍රවෘත්ති සේවය අයත් වන්නේ කුමන රටට ද?

.....................................................................................................

27. ජාත්‍යන්තර පොලිසිය හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?

.....................................................................................................

28. දුප්පතුන් සඳහා බැංකු ක්‍රමයක් ආරම්භ කළ ලෝක ප්‍රසිද්ධ අර්ථ ශාස්ත්‍රඥයා කවරෙක් ද?

.....................................................................................................

29. අභ්‍යවකාශයට යවන ලද ප්‍රථම චන්ද්‍රිකාව හඳුන්වන ලද්දේ කුමන නමකින් ද?

.....................................................................................................

30. නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරයේ ආරම්භක සභාපතිවරයා කවරෙක් ද?

.....................................................................................................

*(ලකුණු 01 × 10 = 10 යි)*

- අංක **31** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර, දී ඇති තිත් ඉර මත කෙටියෙන් ලියන්න.

31. 'රාජ්‍යයක් සැමවිටම සදාචාරවත් විය යුතුය' යන්න පිළිගත් ප්‍රතිමානයකි.
    (i) සදාචාරය නමැති සංකල්පය පැහැදිලි කෙරෙන නිර්වචන දෙකක් දක්වන්න.
        (අ) .....................................................................................
        (ආ) .....................................................................................
    (ii) රාජ්‍යයක් සදාචාරවත් වීමෙන් ලබාගත හැකි යහපත් ප්‍රතිඵල දෙකක් දක්වන්න.
        (අ) .....................................................................................
        (ආ) .....................................................................................
    (iii) රාජ්‍යයක් සදාචාර සම්පන්න නොවීමෙන් ඇති විය හැකි අහිසි ප්‍රතිඵල දෙකක් දක්වන්න.
        (අ) .....................................................................................
        (ආ) .....................................................................................

32. වර්තමාන ලෝකයේ ජල හිඟය උග්‍ර තත්ත්වයකට පත්ව තිබේ.
    (i) (අ) මිහිමත ඇති කරදිය ජලයේ ප්‍රතිශතය කොපමණ ද?
        .....................................................................................
        (ආ) මිහිමත ඇති මිරිදිය ජලයේ ප්‍රතිශතය කොපමණ ද?
        .....................................................................................
    (ii) වර්තමානයේ ජල හිඟය හේතුවෙන් උග්‍ර ලෙස පීඩා විඳින ආසියාතික රටවල් දෙකක් නම් කරන්න.
        (අ) .....................................................................................
        (ආ) .....................................................................................
    (iii) ලෝකයේ ජල හිඟය අවම කිරීම සඳහා යොදා ගත හැකි පිළියම් දෙකක් දක්වන්න.
        (අ) .....................................................................................
        (ආ) .....................................................................................

[ 5 වැනි පිටුව බලන්න.

15881

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014 (2016)


## (04) කළමනාකරණමය අභියෝග්‍යතාව

පැ තුනයි

### විභාග අපේක්ෂකයින්ට උපදෙස්

**ඉතා වැදගත් :**

**පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකරන්න.**



✳ **පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට ඉලක්කම් ලියා නැති උත්තර පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.**
**1 2 3 4**

**ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන හා පස්වන පිටුවල ඇති තිත් ඉරි මත ද ලියන්න.**

.....................................

නිවැරදි බවට නිරීක්ෂකගේ කෙටි අත්සන

.....................................

**වැදගත් :**

✳ මෙම ප්‍රශ්න පත්‍රය **I** හා **II** කොටස්වලින් සමන්විත පිටු **11** කින් හා ප්‍රශ්න **50** කින් යුක්ත වේ.

✳ පිළිතුරු ලිවීමට පෙර ප්‍රශ්න පත්‍රය පිටු අංක අනුව සකසා ගන්න.

✳ **I** කොටසේ ප්‍රශ්න **සියල්ලට ම මෙම පත්‍රයේ ම ද II** කොටසේ ප්‍රශ්න **සියල්ලට ම සපයනු ලබන කඩදාසිවල ද** පිළිතුරු සපයන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය **පැය තුනකි.**

✳ ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.

✳ **දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.**

✳ ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතුය.

✳ ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස **නිල්** හෝ **කළු** පෑනෙන් පමණක් ලියන්න. **පැන්සල් පාවිච්චි නොකරන්න.**

✳ මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.

✳ **අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු, මකන දියර භාවිත කරන ලද හා පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.**

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| පිටුව | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| 2 | 1 - 3 | |
| 3 | 4 - 8 | |
| 4 | 9 - 12 | |
| 5 | 13 - 16 | |
| 6 | 17 - 20 | |
| 7 | 21 - 30 | |
| 8 | 31 - 36 | |
| 9 | 37 - 42 | |
| 10 | 43 - 46 | |
| 11 | 47 - 50 | |
| එකතුව | | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

[ 2 වැනි පිටුව බලන්න.

# I කොටස

● අංක **1** සිට **5** තෙක් ප්‍රශ්න, පහත සඳහන් සිද්ධිය / අවස්ථාව මත පදනම් වේ.

ළමා සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ පාලකවරිය ලෙස විනීතා සිරිවර්ධන මහත්මිය කටයුතු කරන අතර ඊට අමතරව තවත් උපදේශකවරියන් අටදෙනෙකු එම මධ්‍යස්ථානයට අනුයුක්තව සේවය කරති. මෙම උපදේශකවරියන්ගෙන් දෙදෙනෙකු පමණක් මධ්‍යස්ථානයට ආසන්නව පදිංචිවී සිටින නමුත් සෙසු පිරිස දුරබැහැර ප්‍රදේශවල සිට සේවයට පැමිණෙති. එමෙන්ම මෙම උපදේශකවරියන්ගෙන් බොහෝදෙනෙක් තනතුරේ උසස්වීම්වලට අදාළ උසස් අධ්‍යාපන කටයුතුවල නිරතවන අතර ඒ සඳහා සති අන්ත නිවාඩු දින යොදා ගෙන තිබේ. මෙම මධ්‍යස්ථානයේ සේවය පතා ළමුන් සියයකට අධික සංඛ්‍යාවක් ලියාපදිංචි වී සිටින අතර ඔවුන් සඳහා සේවය සැපයීම සතියේ දිනවල දී සිදු කරනු ලබයි. ඒ සඳහා මෙම ළමුන් දෙමව්පියන් හෝ භාරකරුවන් සමග සතියේ දිනවල දී මධ්‍යස්ථානයට පැමිණෙති.

මේ අතර ඉදිරියේ දී සති අන්ත සෙනසුරාදා දිනවල දී ළමා සංවර්ධන මධ්‍යස්ථානය විවෘතව තැබීමට විනීතා සිරිවර්ධන මහත්මිය හදිසියේ තීරණය කළාය. ඒ සඳහා හේතුවක් ලෙස ඉදිරිපත් කරන ලද්දේ මධ්‍යස්ථානයෙන් සේවය ලබා ගැනීමට අපේක්ෂිත රජයේ හා විවිධ රැකියාවල නිරත දෙමව්පියන්ගෙන් හා භාරකරුවන්ගෙන් ලැබුණු ඉල්ලීම් සලකා බලා අදාළ තීරණය ගත් බවයි. එමෙන්ම සෙනසුරාදා දිනය වැඩ කිරීම හේතුවෙන් උපදේශකවරියන්ට සඳුදා දිනය නිවාඩු දිනයක් ලෙස ද ප්‍රකාශයට පත් කරන ලදී. කෙසේ වෙතත් සෙනසුරාදා දිනවල මධ්‍යස්ථානය විවෘතව තැබීම සඳහා ගත් තීරණයත් සමග මධ්‍යස්ථානයේ උපදේශකවරියන් අතර නොසන්සුන්තාවක් ඇති වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඊට විරෝධය පළ කරමින් ළමා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කෙරිණි.

මෙම සිද්ධියට / අවස්ථාවට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

1. සෙනසුරාදා දිනවල ළමා සංවර්ධන මධ්‍යස්ථානය විවෘතව තැබීමට ගන්නා ලද තීරණය සාධාරණීකරණය කිරීමට එක් හේතුවක් වන්නේ,
   (1) සෙනසුරාදා දිනයේ මධ්‍යස්ථානයට පැමිණෙන උපදේශකවරියන්ට හා සේවාලාභීන්ට මුහුණ දීමට සිදුවන ප්‍රවාහන දුෂ්කරතා අවම මට්ටමක පැවතීම ය.
   (2) සෙනසුරාදා දිනයේ දී වැඩ කිරීමට සිදුවීම වෙනුවෙන් උපදේශකවරියන්ට සඳුදා දිනයේ දී නිවාඩුවක් ලබාදීම ය.
   (3) මධ්‍යස්ථානයේ සේවය ලබා ගැනීමට අවස්ථාවක් නොලැබුණු පිරිසකට අවස්ථාවක් ලබාදීමට හැකිවීම ය.
   (4) පාලකවරියට මධ්‍යස්ථානයේ සංවර්ධනය උදෙසා අභිමතය පරිදි තීරණවලට එළැඹීමට හැකිවීම ය. (.........)

2. උපදේශකවරියන් අතර නොසන්සුන්තාවක් ඇති වීමට බලපෑ එක් හේතුවක් විය හැක්කේ,
   (1) සෙනසුරාදා දිනවල මධ්‍යස්ථානයට පැමිණීමේ දී ප්‍රවාහන දුෂ්කරතාවලට මුහුණදීමට සිදුවීම ය.
   (2) දැනට ලියාපදිංචි සංඛ්‍යාවකට වඩා බෙහෙවින් වැඩි ළමුන් සංඛ්‍යාවක් සඳහා සේවය සැපයීමට සිදුවීම ය.
   (3) සෙනසුරාදා දිනවලදී සෙසු දිනවලට වඩා වැඩි ළමුන් සංඛ්‍යාවක් මධ්‍යස්ථානය වෙත පැමිණීමට වැඩි නැඹුරුතාවක් පැවතීම ය.
   (4) සති අන්ත නිවාඩු දිනවලට යොදාගෙන ඇති, උසස්වීම්වලට අදාළ උසස් අධ්‍යාපන කටයුතු සඳහා බාධා සිදුවීම ය. (.........)

3. සෙනසුරාදා දිනවල ළමා සංවර්ධන මධ්‍යස්ථානය විවෘතව තැබීමට ගන්නා ලද තීරණයෙන් සහනයක් සැලසෙන පාර්ශ්වයකි,
   (1) ළමා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා.
   (2) ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ පාලකවරිය.
   (3) ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ උපදේශකවරියන්.
   (4) රැකියාවල නිරත දෙමව්පියන් හා භාරකරුවන්. (.........)

[ 3 වැනි පිටුව බලන්න.

4. ළමා සංවර්ධන මධ්‍යස්ථානය සෙනසුරාදා දිනවල විවෘතව තැබීම සඳහා තීරණය කිරීමට පෙර විනීතා සිරිවර්ධන මහත්මියට ගත හැකිව තිබූ ප්‍රශස්ත පියවරකි,
   (1) මධ්‍යස්ථානයේ උපදේශකවරියන් සමග සාකච්ඡා කිරීම.
   (2) සේවාලාභී ළමුන්ගේ දෙමව්පියන් හා භාරකරුවන් සමග සාකච්ඡා කිරීම.
   (3) ළමා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා සමග සාකච්ඡා කිරීම.
   (4) සේවාලාභී ළමුන් සමග සාකච්ඡා කිරීම.
(.........)

5. ඉදිරිපත්වී ඇති පැමිණිල්ල සම්බන්ධයෙන් ළමා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට ගත හැකි ප්‍රශස්ත පියවරකි,
   (1) සෙනසුරාදා දිනවල මධ්‍යස්ථානය විවෘත කිරීම වහාම අත්හිටුවීම.
   (2) මධ්‍යස්ථාන පාලකවරියට එරෙහිව විනය පරීක්ෂණයක් පැවැත්වීම.
   (3) සේවාලාභී දෙමව්පියන් හා භාරකරුවන් සමග සාකච්ඡා කිරීම.
   (4) මධ්‍යස්ථාන පාලකවරිය හා උපදේශකවරියන් සාකච්ඡාවකට කැඳවීම.
(.........)

*(ලකුණු 01 × 5 = 05 යි)*

- අංක **6** සිට **10** තෙක් ප්‍රශ්න, පහත සඳහන් සිද්ධිය / අවස්ථාව මත පදනම් වේ.

ළමා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවා අංශය භාර සහකාර අධ්‍යක්ෂවරයා විසින් දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන සරණ ළමා සංවර්ධන මධ්‍යස්ථානයට 2015 වසරේ අගෝස්තු මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා එළවළු මිලදී ගැනීම වෙනුවෙන් මධ්‍යස්ථානයේ පාලකවරයා විසින් නිර්දේශ කර ඉදිරිපත් කර ඇති බිල්පත් හා වවුචර් කිහිපයක් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරන ලදී. එම බිල්පත් හා වවුචර්වල පහත සඳහන් දෝෂ හා දුර්වලතා නිරීක්ෂණය විය.

- ❊ බිල්පත් ප්‍රතිපූරණය සඳහා වන වවුචර් මාසිකව දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත් එම උපදෙස් නොසලකා මාස කිහිපයක බිල්පත් එකවර ඉදිරිපත් කිරීම
- ❊ මාස කිහිපයකට අදාළ බිල්පත්වල අංක පිළිවෙළින් ආසන්නතම අංක වීම
- ❊ එකම ආයතනයකින් පමණක් බිල්පත් ඉදිරිපත් කර තිබීම
- ❊ 2015 වසර පුරා සමාන ළමුන් සංඛ්‍යාවක් නේවාසිකව සිටියත් මිලදී ගත් එළවළු ප්‍රමාණ මාසිකව අඩු වැඩිවීම

මෙම සිද්ධියට / අවස්ථාවට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

6. බිල්පත් හා වවුචර්වල නිරීක්ෂිත දෝෂ හා දුර්වලතා සම්බන්ධයෙන් ළමා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට ගත හැකි ප්‍රශස්ත පියවරකි,
   (1) අදාළ වවුචර් හා බිල්පත් සඳහා ගෙවීම් සිදු නොකිරීම.
   (2) වවුචර් හා බිල්පත් පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදු කිරීම.
   (3) එළවළු සපයා ඇති ආයතනයේ හිමිකරුවන් කැඳවා ප්‍රශ්න කිරීම.
   (4) මධ්‍යස්ථාන පාලකවරයාගේ වැඩ තහනම් කර විනය පරීක්ෂණයක් සිදු කිරීම.
(.........)

7. සරණ ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ පාලකවරයා දෙපාර්තමේන්තු උපදෙස් නොසලකා කටයුතු කර ඇති අවස්ථාවකි,
   (1) එකම ආයතනයකින් පමණක් එළවළු මිලදී ගැනීම.
   (2) ආසන්නතම අංක සහිත බිල්පත් ඉදිරිපත් කිරීම.
   (3) බිල්පත් ප්‍රතිපූරණය සඳහා වන වවුචර් මාසිකව ඉදිරිපත් නොකිරීම.
   (4) බිල්පත් හා වවුචර් අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් නොකිරීම.
(.........)

8. 2015 වසර පුරා සරණ ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නේවාසිකව සිටි ළමුන් සංඛ්‍යාව හා සැසඳීමේදී ප්‍රශ්නගත කරුණකි,
   (1) සෑම මාසයක ම ප්‍රමාණවත් ව එළවළු මිලදී ගත්තේ දැයි යන්න.
   (2) එක් එක් මාසයේ මිලදී ගෙන ඇති එළවළු ප්‍රමාණ අඩු-වැඩි වූයේ කුමන හේතු නිසා දැයි යන්න.
   (3) එකම ආයතනයකින් පමණක් එළවළු මිලදී ගැනීමට බලපෑ හේතු මොනවා දැයි යන්න.
   (4) එළවළු මිලදී ගත් බිල්පත් මාසිකව ඉදිරිපත් නොකළේ ඇයි දැයි යන්න.
(.........)

[ 4 වැනි පිටුව බලන්න.

9. අදාළ බිල්පත්වලට ගෙවීම් සිදුකිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයාට ගත හැකි ප්‍රශස්ත පියවරකි,
   (1) පාලකවරයාගේ වැඩ තහනම් කිරීමෙන් අනතුරුව ගෙවීම් සිදු කිරීම.
   (2) පරීක්ෂණයකින් අනතුරුව එහි නිර්දේශ සලකා බලා ගෙවීම් සිදු කිරීම.
   (3) අදාළ බිල්පත්වලට ගෙවීම් සිදු නොකිරීම.
   (4) 2015 අගෝස්තු මාසයේ බිල්පතට පමණක් ගෙවීම් සිදුකිරීම. (.........)

10. සරණ ළමා සංවර්ධන මධ්‍යස්ථානය මගින් දෝෂ සහිත බිල්පත් සහ වවුචර් ඉදිරිපත් කිරීමේ සමස්ත සිදුවීම පාදක කරගනිමින් ළමා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට ගත හැකි ප්‍රශස්ත පියවරකි,
   (1) සරණ ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ සියලුම ගෙවීම් සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් සිදු කිරීම.
   (2) සරණ ළමා සංවර්ධන මධ්‍යස්ථානයට එළවළු සපයා ඇති ආයතනය පිළිබඳව පොලිසියට පැමිණිලි කිරීම.
   (3) වවුචර් සකස් කරන ලද සරණ ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නිලධාරීන් සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් සිදු කිරීම.
   (4) සරණ ළමා සංවර්ධන මධ්‍යස්ථානය මගින් එළවළු මිලදී ගත් ආයතනයට එරෙහිව වහාම නඩු පැවරීම.(.........)

*(ලකුණු 01 × 5 = 05 යි)*

● අංක **11** සිට **15** තෙක් ප්‍රශ්න, පහත සඳහන් සිද්ධිය / අවස්ථාව මත පදනම් වේ.

ළමා සුබසාධන අමාත්‍යාංශයේ ලේකම්වරයාට ලැබුණු නිර්නාමික දුරකථන ඇමතුමකින් කියැවුණේ, එම අමාත්‍යාංශය යටතේ ඇති ළමා සංවර්ධන දෙපාර්තමේන්තුවේ පුරයාය ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ පාලකවරයා විසින් මධ්‍යස්ථාන පරිශ්‍රයේ තිබූ වටිනා ගස් රැසක් කපා දමා ඇති බවයි. අදාළ දුරකථන ඇමතුම සම්බන්ධයෙන් ලේකම්වරයා විසින් ළමා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා දැනුවත් කර වහාම පරීක්ෂණයක් සිදුකර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී.

පුරයාය ළමා සංවර්ධන මධ්‍යස්ථානය තුළ පසුගිය කාල සීමාව තුළ පැවති දුර්වල පරිපාලනය හේතුවෙන් එවකට සිටි පාලකවරයා ඉවත් කර නව පාලකවරයෙක් පත් කරන ලද්දේ මීට මාස කිහිපයකට පෙර දී ය. අභිනවයෙන් පත් කරන ලද පාලකවරයා දෙපාර්තමේන්තුවේ සිටින ඉතා දක්ෂ, අවංක හා කාර්යශූර නිලධාරියකු වුවත් ලේකම්වරයා විසින් දැනුම් දුන් කරුණු සම්බන්ධයෙන් තමන් පෞද්ගලිකව කරුණු සොයා බලා වාර්තා කිරීමට අධ්‍යක්ෂවරයා තීරණය කරන ලදී.

ඒ අනුව පුරයාය ළමා සංවර්ධන මධ්‍යස්ථානය වෙත නිරීක්ෂණ චාරිකාවක් සඳහා ගිය අධ්‍යක්ෂවරයාට දැකගත හැකි වූයේ මාස කිහිපයකට පෙර වල්වැදී ගරා වැටෙමින් තිබූ මධ්‍යස්ථානය වෙනුවට ඉතා දැකුම්කළු පරිසරයක් සහිත මධ්‍යස්ථානයක් නිර්මාණය වී ඇති ආකාරයයි. එසේම මධ්‍යස්ථාන පරිශ්‍රයේ කෙළවරක මැනවින් අසුරා තිබූ ලී කඳන් කිහිපයක් දැකගත හැකි වූයෙන් ඒ පිළිබඳව විමසීමේ දී පාලකවරයා විසින් අධ්‍යක්ෂවරයාට පවසා සිටියේ මධ්‍යස්ථාන පරිශ්‍රයේ අලංකරණ කටයුතු සිදු කිරීමේ දී ආර්ථික වටිනාකමක් නොමැති කුඩා ගසක් කපා ඉවත් කිරීමට සිදු වූ බවත් එම ගසේ ලී කඳන් විධිමත් ක්‍රමවේදයට අනුව ඉවත් කරන තෙක් මේ ආකාරයට ගොඩ ගසා ඇති බවත් ය.

මෙම සිද්ධියට / අවස්ථාවට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

11. ලැබුණු නිර්නාමික දුරකථන ඇමතුම පිළිබඳව ළමා සුබසාධන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශයකි,
   (1) ලේකම්වරයා විසින් අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටිය අනුමත කළ හැකි ය.
   (2) අදාළ දුරකථන ඇමතුමේ තොරතුරු රහස් පොලිසියට යොමු කළ යුතු විය.
   (3) අදාළ තොරතුරු නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කළ යුතු විය.
   (4) නිර්නාමික දුරකථන ඇමතුමක් බැවින් ඒ පිළිබඳව නොසලකා සිටිය යුතු විය. (.........)

12. ලේකම්වරයාගෙන් ලද උපදෙස්වලට අනුව ළමා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට ගත හැකිව තිබූ ප්‍රශස්ත පියවරකි,
   (1) නිර්නාමික දුරකථන ඇමතුමක් බැවින් අදාළ උපදෙස් නොසලකා කටයුතු කිරීම.
   (2) පාලකවරයාට එරෙහිව පුරයාය පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් සටහන් කිරීම.
   (3) දෙපාර්තමේන්තු සහකාර අධ්‍යක්ෂවරයකු පුරයාය ළමා සංවර්ධන මධ්‍යස්ථානය වෙත යවා තොරතුරු සොයා බැලීම.
   (4) පුරයාය ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ පාලකවරයා ස්ථාන මාරු කිරීම. (.........)

13. පුරයාය ළමා සංවර්ධන මධ්‍යස්ථාන පරිශ්‍රයේ තිබූ ගස කපා ඉවත් කිරීමට පෙර පාලකවරයා විසින් ගතයුතුව තිබූ පියවරකි,
(1) අමාත්‍යාංශ ලේකම්වරයා දැනුවත් කිරීම.
(2) දෙපාර්තමේන්තු අධ්‍යක්ෂවරයා දැනුවත් කිරීම.
(3) මධ්‍යස්ථාන කාර්යමණ්ඩලය දැනුවත් කිරීම.
(4) පුරයාය පොලිස් ස්ථානාධිපති දැනුවත් කිරීම. (.........)

14. ළමා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන්ගේ පෙර හා වර්තමාන සේවා කටයුතු පිළිබඳ තොරතුරු ලබා ගැනීම එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට වැදගත් වන අවස්ථාවකි,
(1) ගැටලු හඳුනා ගැනීම.
(2) අනාගත සැලසුම් සම්පාදනය.
(3) නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව තක්සේරු කිරීම.
(4) නිලධාරීන්ගේ වැටුප් වර්ධක අනුමත කිරීම. (.........)

15. පුරයාය ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නිරීක්ෂණ චාරිකාවෙන් පසු අධ්‍යක්ෂවරයා විසින් සිදු කළ යුත්තකි,
(1) අනවසරයෙන් ගසක් කපා දැමීම මත පාලකවරයාගේ වැඩ තහනම් කිරීම.
(2) ගස කපා ඉවත් කිරීම පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදු කිරීම.
(3) නිරීක්ෂණයෙන් අනාවරණය කර ගත් කරුණු හා මධ්‍යස්ථානයේ වර්තමාන තත්ත්වය පිළිබඳව ලේකම්වරයාට වාර්තා කිරීම.
(4) වෙනත් පාලකවරයකු පුරයාය ළමා සංවර්ධන මධ්‍යස්ථානයට කඩිනමින් පත් කිරීම. (.........)

*(ලකුණු 01 × 5 = 05 යි)*

● අංක **16** සිට **20** තෙක් ප්‍රශ්න, පහත සඳහන් සිද්ධිය / අවස්ථාව මත පදනම් වේ.

වාසල බණ්ඩාර මහතා නාගරික ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් වන මාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම්වරයා වේ. සිය කාර්යාලයේ රාජකාරියේ නිරතව සිටිය දී වාසල බණ්ඩාර මහතාට ලැබුණු දුරකථන ඇමතුමකින් කියැවුණේ, කොට්ඨාශයේ නිවසක තනිවම කුඩා දරුවන් දෙදෙනෙකු රඳවා ඇති බවයි.

දුරකථනයෙන් ලද තොරතුරුවලට අනුව වහාම එම ප්‍රදේශයේ ග්‍රාමනිලධාරී සමග කාර්යාලයේ නිලධාරී කණ්ඩායමක් අදාළ නිවස පරීක්ෂාවට වාසල බණ්ඩාර මහතා විසින් යොමු කරන ලදී. එහි දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

※ වයස අවුරුදු 10 ක පමණ දරුවකු සහ වයස අවුරුදු 03 ක පමණ කුඩා දැරියක නිවසේ තනිව ම සිටින බව
※ නිවසේ දොර ජනෙල් අගුලු ලා ඇති බව
※ දරුවන් දෙදෙනා සෙල්ලම් කරමින් සිටින බව
※ නිවස වටා තාප්පයකින් ආවරණය වී තිබෙන බව

වැඩිදුරටත් දරුවන් දෙදෙනා පිළිබඳව තොරතුරු සොයා බැලීමේදී අනාවරණය වූයේ, සෑම සතියේ දිනයකම දෙමව්පියන් විසින් දරුවන් දෙදෙනාට ආහාර හා සෙල්ලම් බඩු ඇතුළු වෙනත් අවශ්‍යතා පිළියෙළ කර දොර අගුලුලා මේ ආකාරයට රැකියා සඳහා පිටත්ව යන බව ය. එහිදී වැඩිමහල් දරුවා විසින් දෙමව්පියන් ආපසු පැමිණෙන තෙක් කුඩා දැරිය රැකබලා ගන්නා බවත් දරු දෙදෙනාට මෙම සිදුවීම සාමාන්‍ය කරුණක් බවට පත්ව ඇති බවත් වැඩිදුරටත් අනාවරණය කර ගත හැකි විය.

මෙම සිද්ධියට / අවස්ථාවට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

16. මෙම සිදුවීම සම්බන්ධයෙන් වාසල බණ්ඩාර මහතා විසින් වහාම ගතයුතු පියවර වන්නේ,
(1) දරුවන් දෙදෙනා ළමා නිවාසයකට යොමු කිරීම ය.
(2) පොලිසිය දැනුවත් කර දරුවන් දෙදෙනාගේ ආරක්ෂාව තහවුරු කිරීම ය.
(3) දරුවන් දෙදෙනා තම භාරකාරත්වය යටතට පවරා ගැනීම ය.
(4) දරුවන් දෙදෙනා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට රැගෙන ඒම ය. (.........)

[ 6 වැනි පිටුව බලන්න.

17. දරුවන් දෙදෙනා සම්බන්ධයෙන් වාසල බණ්ඩාර මහතාට ලැබුණු තොරතුරු පොලිසියට වාර්තා වූයේ නම්, පොලිසිය මගින් ගතයුතු කඩිනම් පියවර වන්නේ,
    (1) දරුවන් දෙදෙනා පොලිස් භාරයට ගෙන දෙමව්පියන් පොලිසියට කැඳවා පරීක්ෂණ ආරම්භ කිරීම ය.
    (2) දරුවන් දෙදෙනා උසාවියට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු පිළියෙල කිරීම ය.
    (3) දරුවන් දෙදෙනා දෙමව්පියන් සිටින ස්ථානයට රැගෙන ගොස් බාරදීම ය.
    (4) දරුවන් දෙදෙනා ප්‍රාදේශීය ලේකම්වරයා වෙත බාරදීම ය. (.........)

18. මෙම දරුවන් දෙදෙනාගේ දෙමව්පියන් විසින් සිදු කර ඇති නීති විරෝධී ක්‍රියාවකි,
    (1) දරුවන් නිවසේ සිටින බවට ප්‍රාදේශීය ලේකම් දැනුවත් නොකිරීම.
    (2) දරුවන් නිවසේ සිටින බවට පොලිසිය දැනුවත් නොකිරීම.
    (3) දරුවන් නිවසේ සිටින බවට අධිකරණය දැනුවත් නොකිරීම.
    (4) දරුවන් නිවසේ අනාරක්ෂිත ලෙස රඳවා තැබීම. (.........)

19. වැඩිමහල් දරුවාගේ අයිතිවාසිකම් කඩවී ඇති අවස්ථාවකි,
    (1) පොලිසියට රැගෙන යාම. (2) සහෝදරිය සමග නිවසේ රැඳී සිටීම.
    (3) පාසල් යාමට අවස්ථාවක් නොලැබීම. (4) නිවසේ ආරක්ෂාවට කිසිවකු නොසිටීම. (.........)

20. මෙම සිදුවීම පිළිබඳව පුරවැසියකුට දැනුම් දිය හැකි තවත් ආයතනයකි,
    (1) සේවා නියුක්ති කාර්යාංශය. (2) ළමා රක්ෂණ අධිකාරිය.
    (3) නීති ආධාර කොමිසම (4) සමථ මණ්ඩලය. (.........)

*(ලකුණු 01 × 5 = 05 යි)*

● අංක **21** සිට **30** තෙක් ප්‍රශ්න, පහත සඳහන් සිද්ධිය / අවස්ථාව මත පදනම් වේ.

මානව සම්පත් සංවර්ධන අධිකාරිය රජය සතු ව්‍යවස්ථාපිත අධිකාරියකි. මෙම අධිකාරිය පිහිටුවා වසර 25 ක් පමණ ගතවී ඇතත් අධිකාරියෙන් අපේක්ෂිත අරමුණු මෙතෙක් ඉටුකර ගැනීමට නොහැකි වී ඇත. එම නිසා මෙම අධිකාරිය නව අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ පූර්ණ ප්‍රතිව්‍යුහගතකරණයකට ලක් කිරීමට රජය කටයුතු කරන ලදී.

මානව සම්පත් සංවර්ධන අධිකාරියේ නව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරියේ අපේක්ෂිත අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා කෙටිකාලීන හා දිගුකාලීන උපාය මාර්ග සැලසුම් කරන ලදී. එහිදී ඉතා කෙටි කාලයක් තුළදී අධිකාරියේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා විශේෂ වැඩසටහනක් ආරම්භ කරන ලදී. මේ සඳහා අධිකාරියේ නිමැවුම් මෙන්ම යෙදවුම් සැලකිල්ලට ගත් අතර අධිකාරියේ අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීමට ඵලදායී මාණ්ඩලිකරණයක් අධිකාරිය තුළ සිදු කිරීමට ද සැලසුම් කරන ලදී.

මෙහිදී අධිකාරියේ ඒ ඒ රැකියාවල වගකීම් හඳුනාගනිමින් හා එම වගකීම් ඇතුළත් කරමින් සෑම රැකියාවක් සම්බන්ධයෙන් ම රැකියා විශ්ලේෂණ සකස් කරන ලද අතර එම විශ්ලේෂණ උපයෝගී කර ගනිමින් සෑම රැකියාවක් සඳහා ම රැකියා පිරිවිතර ද සකස් කරන ලදී. එහිදී ඒ ඒ රැකියා සඳහා අවශ්‍ය අවම අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් ඇතුළත් කරන ලද අතර අධිකාරිය තුළ සිදු කරනු ලබන සමස්ත මාණ්ඩලිකරණ ක්‍රියාවලිය තුළින් අධිකාරියට කෙටි කාලීනව හා දිගුකාලීනව සෑම මට්ටමකම තනතුරුවලට අවශ්‍ය සුදුසුකම් ලත් පුද්ගලයින්ගේ අවශ්‍යතා හඳුනාගෙන බඳවා ගැනීමට සැලසුම් කෙරිණි. මේ සඳහා විශේෂයෙන් අධිකාරියේ පරමාර්ථ හා අරමුණු ඉලක්ක කරගනිමින් මූලික පියවර ලෙස අධිකාරියට අවශ්‍ය මානව සම්පත් සැලසුම් කරන ලද අතර එහිදී අනාගත අවශ්‍යතා සලකා මානව සම්පත් සැලසුම් කිරීමට මූලිකව ක්‍රියා කරන ලදී.

මේ ආකාරයට අධිකාරියේ නව අධ්‍යක්ෂ මණ්ඩලය කෙටිකාලීන හා දිගුකාලීන අවශ්‍යතා සලකා මානව සම්පත් සැලසුම් කිරීමේ දී දැනට අධිකාරිය තුළ සේවයේ නියුතු සේවක භවතුන් ඵලදායී ලෙස අධිකාරියේ මානව සම්පත් සංවර්ධන ප්‍රවාහයට ඇතුළත් කිරීමට කටයුතු කරන ලදී.

විශේෂයෙන් අධිකාරියේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාව වැඩි කර ගැනීම සඳහා මෙම සේවකභවතුන්ගේ සේවය ඵලදායී ලෙස යෙදවීමට සැලසුම් කෙරිණි. මෙහිදී අධිකාරියේ කළමනාකරණ මට්ටම් ප්‍රතිව්‍යුහගතකරණය කිරීම හා සේවක දිරි ගැන්වීමේ ක්‍රම හඳුන්වාදීම සිදු කරන ලද අතර සේවක භවතුන්ට විධිමත් රාජකාරි පැවරීම් සිදු කර අධිකාරියේ අරමුණු, පරමාර්ථ හා නීතිරීති පිළිබඳව මූලික අවබෝධයක් සමස්ත සේවක මණ්ඩලයට ලබාදීමට අවශ්‍ය පියවර ගැනීම තුළින් යහපත් සේවා පරිසරයක් අධිකාරිය තුළ ගොඩනැගීමට ද බලාපොරොත්තු විය.

වසර ගණනාවක සිට විවිධ පරිපාලන විෂමතාවන්ට ගොදුරුවී සිටින සේවක භවතුන් තුළින් අධිකාරිය තුළ අවිධිමත් සංවිධාන කිහිපයක්ම ගොඩ නැගී තිබුණි. සිය සේවක අයිතීන් ආරක්ෂා කර ගැනීම සඳහා සංවිධානය වී සිටින මෙම අවිධිමත් සංවිධානවල නියෝජිතයින් ද සම්බන්ධ කරගනිමින් නව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරිය තුළ විධිමත් ලෙස වැටුප් විෂමතා සමාලෝචන කමිටුවක් හා දුක් ගැනවිලි කමිටුවක් ස්ථාපනය කරන ලදී.

[ 7 වැනි පිටුව බලන්න.

මෙම සිද්ධියට / අවස්ථාවට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර දී ඇති තිත් ඉර මත කෙටියෙන් ලියන්න.

21. මානව සම්පත් සංවර්ධන අධිකාරිය මාණ්ඩලීකරණයේ ප්‍රධාන කළමනාකරණ කාර්යය කුමක් ද?

........................................................................................................................

22. එම කළමනාකරණ කාර්යය සිදු කිරීම සඳහා වූ ක්‍රියාවලියේ මූලික පියවර කුමක් ද?

........................................................................................................................

23. එම පියවර සඳහා වූ ක්‍රියාවලියේ දී අනුගමනය කළ යුතු මූලික ක්‍රියාමාර්ගය කුමක් ද?

........................................................................................................................

24. රැකියාවකට අදාළ වගකීම් ඇතුළත් ලේඛනය හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?

........................................................................................................................

25. මානව සම්පත් සංවර්ධන අධිකාරියේ ඒ ඒ රැකියා සඳහා සකස් කරනු ලබන රැකියා පිරිවිතරයකට ඇතුළත් කළයුතු එක් කරුණක් සඳහන් කරන්න.

........................................................................................................................

26. මානව සම්පත් සංවර්ධන අධිකාරියේ ඵලදායීතාව වැඩි කර ගැනීම සඳහා උපයෝගී කර ගැනීමට අපේක්ෂිත එක් ක්‍රමෝපායක් සඳහන් කරන්න.

........................................................................................................................

27. මානව සම්පත් සංවර්ධන අධිකාරිය තුළ යහපත් සේවා පරිසරයක් ගොඩනැගීම සඳහා යොදාගනු ලබන එක් ක්‍රියාමාර්ගයක් සඳහන් කරන්න.

........................................................................................................................

28. මානව සම්පත් සංවර්ධන අධිකාරියේ කාර්යක්ෂමතාව මැනීම සඳහා යොදා ගත හැකි එක් දර්ශකයක් නම් කරන්න.

........................................................................................................................

29. මානව සම්පත් සංවර්ධන අධිකාරිය තුළ අවිධිමත් සංවිධාන බිහිවීමට තුඩු දුන් එක් හේතුවක් සඳහන් කරන්න.

........................................................................................................................

30. මානව සම්පත් සංවර්ධන අධිකාරිය තුළ ගොඩනගන ලද එක් විධිමත් සංවිධානයක් නම් කරන්න.

........................................................................................................................

*(ලකුණු 01 × 10 = 10 යි)*

- අංක **31** සිට **35** තෙක් ප්‍රශ්න, පහත සඳහන් සිද්ධිය / අවස්ථාව මත පදනම් වේ.

යටිතල පහසුකම් සංස්ථාවේ නව සභාපතිවරයා ලෙස පත්වූ වික්‍රම සිරිවර්ධන මහතා සිය රාජකාරි කටයුතු ආරම්භ කරන ලද්දේ, සංස්ථාවේ සංවිධාන ව්‍යුහය පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කරමිනි.

කාර්යානුබද්ධ සංවිධානයක් ලෙස ගොඩනැගී ඇති මෙම සංස්ථාවේ කාර්ය මණ්ඩලය හා කාර්යන් අතර ඇති සම්බන්ධතාව අධ්‍යයනය කිරීම සඳහා සංස්ථාවේ සංවිධාන ව්‍යුහය නිරීක්ෂණය කිරීමේ දී සංස්ථාවේ නිලධාරීන් අතර බලතල බෙදී ගොස් ඇති ආකාරයත් සංස්ථාව තුළ එම නිලධාරීන්ට හිමිව ඇති ස්ථානයත් සභාපතිවරයාට හඳුනාගත හැකි විය.

විශේෂයෙන් යටිතල පහසුකම් සංස්ථාවේ ඒ ඒ අංශ මගින් ඉටු කරන කාර්යන්ට වැදගත් ස්ථානයක් හිමිවී ඇති ආකාරයත් එම කාර්යන් අධීක්ෂණය සඳහා වෙන වෙනම අධීක්ෂණ නිලධාරීන් ස්ථානගත වී ඇති ආකාරයත් සංස්ථා සංවිධාන ව්‍යුහය තුළ දක්නට ලැබිණි. එමගින් ඒ ඒ කාර්යන්ට අදාළ ව එම අංශවල නිලධාරීන්ට විශේෂ ප්‍රාගුණ්‍යයක් ඇතිවීමත්, අංශ මට්ටමින් තීරණ ගැනීමේ පහසුවක් ඇති වී ඇති බවත් නිරීක්ෂණය කළ හැකි විය.

කෙසේ වෙතත් සංස්ථාවේ මෙම සංවිධාන ව්‍යුහය තුළ නිලධාරීන් වගකීමට බැඳීම අංශ මට්ටමින් පමණක් සිදුවන බැවින් නිලධාරීන්ගේ වගකීමේ අවිනිශ්චිතභාවයක් සංස්ථාව තුළ දැකිය හැකි බවත් එසේ අංශ මට්ටමින් වගකීම් දැරීම තුළින් සංස්ථාවේ පොදු සම්බන්ධීකරණයේ දී ගැටලු මතුවිය හැකි බවත් නව සභාපතිවරයාට පැහැදිලි විය.

[ 8 වැනි පිටුව බලන්න.

මෙම සිද්ධියට / අවස්ථාවට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර දී ඇති තිත් ඉර මත කෙටියෙන් ලියන්න.

31. කාර්යානුබද්ධ සංස්ථාවක් වශයෙන් යටිතල පහසුකම් සංස්ථාවේ සංවිධාන ව්‍යුහයේ දක්නට ඇති ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

32. යටිතල පහසුකම් සංස්ථාවේ සංවිධාන ව්‍යුහය තුළ නව සභාපතිවරයාට හඳුනාගත හැකි වූ ගැටලු දෙකක් සඳහන් කරන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

33. යටිතල පහසුකම් සංස්ථාවේ පවතින සංවිධාන ව්‍යුහය තුළින් සැලසී ඇති වාසි දෙකක් දක්වන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

34. යටිතල පහසුකම් සංස්ථාවේ නව සභාපතිවරයාට සංවිධාන සටහනකින් පැහැදිලි කරගත හැකි කරුණු දෙකක් දක්වන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

35. යටිතල පහසුකම් සංස්ථාවේ ස්ථාපිත වී ඇති සංවිධාන ව්‍යුහය තුළින් එම සංස්ථාවට පරිපාලනමය වශයෙන් සිදු විය හැකි අවාසි දෙකක් දක්වන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

*(ලකුණු 02 × 5 = 10 යි)*

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්න, පහත සඳහන් සිද්ධිය / අවස්ථාව මත පදනම් වේ.

ජාතික හරිත සේවා අධිකාරියට 'හරිත නියාමකයින්' බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවා සුදුසු අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීමට තීරණය කරන ලදී. එහිදී මෙම කාර්යය අධිකාරිය අප්‍රසාදයට පත් නොවන ආකාරයට සුදුසුම අපේක්ෂකයින් තෝරා ගැනීමටත්, සුදුසුකම් නොලබන අපේක්ෂකයින් නීතිමය කටයුතුවලට යොමු නොවන ආකාරයටත් සම්මුඛ පරීක්ෂණය මැනවින් සැලසුම් කර මෙහෙයවීමටත්, අපේක්ෂකයින්ගේ පෞරුෂත්වය හා තනතුර සඳහා විශේෂ යෝග්‍යතාව සඳහා වන සුදුසුකම් මැනවින් ඇගයීමට ලක්කර තීරණ ගැනීමටත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට උපදෙස් මාලාවක් ද සකස් කරන ලදී.

මෙම තනතුර සඳහා අපේක්ෂකයින් විශාල සංඛ්‍යාවක් ඉදිරිපත් වුවහොත් මූලික සුදුසුකම් ඇතුළු නිර්ණායක කිහිපයක් පදනම් කරගනිමින් මූලික සුදුසුකම් ලත් අපේක්ෂකයින් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට තීරණය කරන ලදී. එසේ කැඳවන අපේක්ෂකයන් සංඛ්‍යාව ද සියයකට වඩා වැඩිවුවහොත් එම අපේක්ෂකයින් ලිඛිත පරීක්ෂණයකට යොමු කර ඉන් සමත්වන අපේක්ෂකයන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට වැඩිදුරටත් තීරණය කරන ලදී. මීට අමතරව හරිත නියාමක තනතුර සඳහා වන සම්මුඛ පරීක්ෂණයේ දී අපේක්ෂකයින්ගේ විෂයය පිළිබඳ දැනුම හා ඒ සඳහා ඇති කුසලතාව මැනගැනීම සඳහා ව්‍යුහගත වාචික ප්‍රශ්න ක්‍රමයක් අනුගමනය කිරීමට ද තීරණය කරන ලදී.

මෙම සිද්ධියට / අවස්ථාවට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර දී ඇති තිත් ඉර මත කෙටියෙන් ලියන්න.

36. හරිත නියාමක තනතුර සඳහා අයදුම් කරනු ලබන අපේක්ෂකයින්ගෙන් සුදුසුම පුද්ගලයින් පමණක් සම්මුඛ පරීක්ෂණයට යොමු කර ගැනීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රම දෙකක් සඳහන් කරන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

37. සමස්ත සම්මුඛ පරීක්ෂණය සංවිධානය කරගැනීමේ දී අවධානය යොමු කළ යුතු ප්‍රධාන අංශ දෙකක් දක්වන්න.

(i) ....................................................................................................

(ii) ....................................................................................................

38. අපේක්ෂකයින්ගේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ දී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අවධානය යොමු කළ යුතු කරුණු දෙකක් සඳහන් කරන්න.

(i) ....................................................................................................

(ii) ....................................................................................................

39. සම්මුඛ පරීක්ෂණයේ දී අපේක්ෂකයින් වෙත යොමු කළයුතු ප්‍රශ්න සම්බන්ධයෙන් වැදගත් වන කරුණු දෙකක් දක්වන්න.

(i) ....................................................................................................

(ii) ....................................................................................................

40. අපේක්ෂකයින්ගේ සුදුසුකම් නිසිලෙස සම්මුඛ පරීක්ෂණයේ දී ඇගැයීමට ලක් නොවුවහොත් ඇති විය හැකි අවාසි දෙකක් සඳහන් කරන්න.

(i) ....................................................................................................

(ii) ....................................................................................................

*(ලකුණු 02 × 5 = 10 යි)*

- අංක **41** සිට **45** තෙක් ප්‍රශ්න, පහත සඳහන් සිද්ධිය / අවස්ථාව මත පදනම් වේ.

දිවයිනේ දුෂ්කර දිස්ත්‍රික්කයක් වන මහවෙල දිස්ත්‍රික්කය සංවර්ධනය සඳහා රජය මගින් මහවෙල සංවර්ධන අධිකාරිය පිහිටුවීමට තීරණය කරන ලදී. ඒ අනුව අධිකාරිය පිහිටුවීමේ අරමුණු හා පරමාර්ථ ප්‍රමුඛ කරගනිමින් මහවෙල සංවර්ධන අධිකාරිය පිහිටුවීමේ සැලසුම් කටයුතු ආරම්භ කරන ලදී. මෙම සැලසුම් මැනවින් සකස් කිරීමේ වගකීම විශේෂඥ කමිටුවක් වෙත පවරන ලද අතර එමගින් අධිකාරියේ ප්‍රමුඛ කාර්යන් මෙන්ම අධිකාරියට අනාගතයේ දී ඇති විය හැකි ගැටලු ද හඳුනා ගැනීමට බලාපොරොත්තු විය. එසේම මෙම සැලසුම් සකස් කිරීමේ දී අධිකාරියේ අරමුණු වෙත ගමන් කිරීමට සුදුසු පරිසරයක් ගොඩනැගීමටත්, උපාය මාර්ග හා ප්‍රතිපත්ති සකස් කිරීමටත් අවධානය යොමු කරන ලදී.

මෙම ක්‍රියාවලියේ දී සැලසුම් යථාර්ථයක් බවට පත්කර ගැනීම සඳහා අධිකාරිය තුළින් එල්ල විය හැකි වැඩ වර්ජන හා උද්ඝෝෂණ වැනි සේවක බලපෑම් කෙරෙහි ද දැඩි අවධානයක් යොමු කරන ලද අතර අධිකාරියේ විනය මැනවින් ගොඩනැගීම උදෙසා නීති හා උපාය මාර්ග සැලසුම් පද්ධතියක් ද ගොඩනැගීමට අවධානය යොමු විය. මේ අනුව මහවෙල සංවර්ධන අධිකාරිය පිහිටුවීමේ සමස්ත සැලසුම් ක්‍රියාවලිය පදනම් කර ගනිමින් මහවෙල සංවර්ධන අධිකාරියේ පරිපාලන ව්‍යුහය සැලසුම් කර අවශ්‍ය අංශ හා ශාඛා පිහිටුවීමටත්, එම අංශ හා ශාඛා සඳහා සේවකයින් බඳවා ගැනීමටත් තීරණය විය.

මෙම සිද්ධියට / අවස්ථාවට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි **පිළිතුර** දී ඇති තිත් **ඉර** මත කෙටියෙන් ලියන්න.

41. මහවෙල සංවර්ධන අධිකාරිය පිහිටුවීමේ කටයුතු මැනවින් සැලසුම් කිරීම තුළින් ලබා ගත හැකි ප්‍රතිලාභ දෙකක් දක්වන්න.

(i) ....................................................................................................

(ii) ....................................................................................................

42. මහවෙල සංවර්ධන අධිකාරිය පිහිටුවීමේ කටයුතු සැලසුම්කරණයේ දී වැදගත් වන කරුණු දෙකක් සඳහන් කරන්න.

(i) ....................................................................................................

(ii) ....................................................................................................

[ 10 වැනි පිටුව බලන්න.

43. මහවෙල සංවර්ධන අධිකාරිය සැලසුම්කරණයේ දී යොදා ගැනීමට අපේක්ෂිත සැලසුම් වර්ග දෙකක් දක්වන්න.

(i) ..........................................................................................

(ii) ..........................................................................................

44. මහවෙල සංවර්ධන අධිකාරියේ පරිපාලන ව්‍යුහය සැලසුම්කරණයේ දී වැදගත් වන කරුණු දෙකක් දක්වන්න.

(i) ..........................................................................................

(ii) ..........................................................................................

45. මහවෙල සංවර්ධන අධිකාරියේ සැලසුම් අසාර්ථක වීමට ආයතනයේ අභ්‍යන්තර පරිසරයෙන් එල්ල විය හැකි බලපෑම් දෙකක් දක්වන්න.

(i) ..........................................................................................

(ii) ..........................................................................................

*(ලකුණු 02 × 5 = 10 යි)*

## II කොටස

● අංක **46** සිට **50** තෙක් ප්‍රශ්න, පහත සඳහන් සිද්ධිය / අවස්ථාව මත පදනම් වේ.

දිනපතා පුවත්පතක් වන සුළිය පුවත්පතේ ප්‍රධාන පුවතකින් වාර්තා වූයේ රජය සතු සමාගමක් වන පහසුකම් හා සේවා සමාගම පිළිබඳ වාර්තාවකි.

වසර දෙකකට පෙර ලාභ ලබමින්, භාණ්ඩාගාරයට ලාභාංශ ගෙවමින්, ඵලදායිතා, ව්‍යාපාරික විශිෂ්ටතා, තත්ත්ව සම්මාන ආදි සම්මාන රැසක් දිනාගෙන ඇති මෙම සමාගමට වසර දෙකකට පෙර පත් කරන ලද නව පාලනාධිකාරියේ අදූරදර්ශී ක්‍රියාපිළිවෙත් රැසක් අදාළ පුවතින් වාර්තා කර තිබිණි.

විශේෂයෙන් නව පාලනාධිකාරිය පත්වීමට පෙර සිටි පාලනාධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද විධිමත් සේවක උසස්වීම් හා බඳවා ගැනීමේ ක්‍රමවේද වෙනුවට නව පාලනාධිකාරිය විසින් තම අභිමතය පරිදි උසස්වීම් හා බඳවා ගැනීම් සිදු කිරීමත්, භාණ්ඩාගාරයේ හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව උපදේශකයන් බඳවා ගෙන ඔවුන්ට විවිධ වරප්‍රසාද ලබාදීමත් අදාළ පුවත්පතින් කරුණු සහිතව වාර්තා කර තිබිණි.

එසේම සමාගමේ අරමුණු හා පරමාර්ථ කරා යාමේදී සේවක අදහස් ලබා ගනිමින් තීරණ ක්‍රියාත්මක කිරීම, එම තීරණ ක්‍රියාත්මක කිරීමේදී සාමූහික වගකීමක් දැරීම මෙන්ම එම තීරණවල ඉහළ ගුණාත්මකභාවයක් තිබීම, සාමූහික වගකීමක් කාර්යමණ්ඩලය තුළ තිබීමෙන් යහපත් වැඩ ආකල්ප ප්‍රවර්ධනය වීම වැනි සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදී පාලන රටාවක පැවති පහසුකම් හා සේවා සමාගමේ එම පාලන රටාවට ඉදුරාම වෙනස් පාලන රටාවක් නව පාලනාධිකාරිය තුළින් සමාගම තුළ ස්ථාපිතව ඇති බව සුළිය පුවතින් වැඩිදුරටත් වාර්තා කර තිබිණි.

සේවක සුභසාධන හා සේවක දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමට තිබූ යාන්ත්‍රණය නව පාලනාධිකාරිය විසින් ක්‍රියාත්මක නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස සේවක අයිතීන් කප්පාදු වී ඇති බවත් අදාළ පුවතින් වාර්තා කර ඇත. විශේෂයෙන් නව පාලනාධිකාරියේ සභාපතිවරයා වෙත සුළිය පුවත්පතේ වාර්තාවෙන් සෘජු ලෙස චෝදනා එල්ල කර ඇති අතර සභාපතිවරයා විසින් තමන්ට හිතවත් සේවකයින්ට විවිධ වරප්‍රසාද හා වරදාන ප්‍රදානය කරමින් මධ්‍යස්ථ හා තමන්ට විරුද්ධ සේවකභවතුන්ට එරෙහිව දැඩි ක්‍රියාපිළිවෙතක් අනුගමනය කරන බවද අදාළ පුවතින් වාර්තා කර ඇත.

එසේම බලය හා පාලනය සියතට ගනිමින්, තීරණ ගැනීමේ තනි අයිතිය තමන් සතු කරගනිමින්, විවිධ නියෝග හා විධාන නිකුත් කරමින් නව සභාපතිවරයා බලවාදී නායකයකු ලෙස සේවක මර්දන ක්‍රියාවලියක නිරත වන බවද සුළිය පුවත්පතේ වාර්තාවෙන් වැඩිදුරටත් කරුණු වාර්තා කරයි.

මෙම සිද්ධියට / අවස්ථාවට අනුව පහත එක් එක් ප්‍රශ්නයට සපයනු ලබන කඩදාසිවල පිළිතුරු ලියන්න.

46. පහසුකම් හා සේවා සමාගමේ වර්තමාන හා පෙර පාලනාධිකාරීන් තුළ දක්නට තිබූ නායකත්ව ශෛලීන් සංසන්දනාත්මකව විස්තර කරන්න. *(ලකුණු 08 යි)*

[ 11 වැනි පිටුව බලන්න.

47. පහසුකම් හා සේවා සමාගමේ පෙර තිබූ පාලනාධිකාරිය තුළින් ස්ථාපිත වී තිබූ සමාගමේ කාර්යාලීය වැඩ පරිසරයේ ස්වභාවය කෙබඳු දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*

48. එම කාර්යාලයීය වැඩ පරිසරය ගොඩනැගීම කෙරෙහි බලපෑ ප්‍රධාන සාධක කවරේ දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*

49. පහසුකම් හා සේවා සමාගමේ නව පාලනාධිකාරියේ ක්‍රියාපිළිවෙත තුළින් සමාගමට සිදු විය හැකි අහිතකර ප්‍රතිඵල විවේචනාත්මකව විස්තර කරන්න. *(ලකුණු 08 යි)*

50. සුළිය පුවත්පතේ පළවූ වාර්තාව සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කිරීමට පහසුකම් හා සේවා සමාගම අයත් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයකු පත් කරයි. ඒ අනුව අදාළ සහකාර ලේකම්වරයා ඔබ යැයි ද අදාළ පුවතේ සඳහන් කරුණු සත්‍ය යැයි ද උපකල්පනය කරමින් අමාත්‍යාංශ ලේකම්වරයාට යොමු කිරීම සඳහා විමර්ශන වාර්තාවක් කෙටුම්පත් කරන්න. *(ලකුණු 08 යි)*

* * *

15881

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

| ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 (i) | |
| 4 (ii) | |
| 4 (iii) | |
| එකතුව | |
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் /
Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ
විවෘත තරග විභාගය - 2014 (2016)

**(05) නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා**

පැ තුනයි

● ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.

විභාග අංකය : ...........................

**1.** පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරාගෙන විශ්ලේෂණාත්මකව හා තර්කානුකූලව කරුණු ඉදිරිපත් කරමින් වචන සංඛ්‍යාව **250-300** අතර වන සේ වාක්‍ය රචනයක් ලියන්න.

(i) දේශපාලන බලපෑම්වලින් හෝ දූෂණයෙන් හෝ තොරව අපක්ෂපාතීව, ස්වාධීනව හා කාර්යක්ෂමව මහජනතාවට සේවය කිරීම රාජ්‍ය සේවකයාගේ වගකීමයි.

(ii) මෙරට විද්‍යුත් ජනමාධ්‍ය වැඩසටහන්වල දේශීය අනන්‍යතාව ආරක්ෂා කිරීමත් ඉහළ ගුණාත්මකභාවයක් හා ප්‍රමිතියක් පවත්වා ගැනීමත් උදෙසා ගත හැකි ක්‍රියා මාර්ග

(iii) රටක පුරවැසියන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් අබිබවා ආර්ථික හා සමාජයීය අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමෙන් ඇති විය හැකි ප්‍රතිවිපාක

(iv) අයි එස් අයි එස් ත්‍රස්තවාදීන්ගේ අමානුෂික ක්‍රියාකාරකම් මැඩ පැවැත්වීම සඳහා ලෝක බලවතුන් යොදන උපාය මාර්ග හා ඒවායේ සාර්ථකභාවය

(v) රටක නැති බැරි ජනතාව සදහටම සහනාධාර මත යැපෙන්නට සැලැස්වීමට වඩා ඇති හැකි පිරිසක් ලෙස ස්වශක්තියෙන් නැගී සිටීමට අත දීමේ යෝග්‍යතාව

(vi) ජනවාර්ගික, ආගමික, දේශපාලනික හා භාෂාත්මක වශයෙන් ව්‍යාප්ත වන අන්තවාදී අදහස් නිසා රටක සංහිඳියාව හා සහජීවනය කෙරෙහි එල්ල විය හැකි තර්ජන

[ 2 වැනි පිටුව බලන්න.

(ලකුණු 30 යි)

[ 3 වැනි පිටුව බලන්න.

**2.** පහත දැක්වෙන පාඨය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න. සාරාංශය අවසානයේ ඔබ ලියූ වචන සංඛ්‍යාව සඳහන් කරන්න.

අතීතයේ සිට ම ශ්‍රී ලංකාව තුළ කාර්යක්ෂම ජල කළමනාකරණයක් පැවැති බව පිළිගනු ලැබූව ද, ආර්ථික කටයුතුවල ප්‍රසාරණයත් සමග බහුවිධ අවශ්‍යතා සඳහා ඉහළ යන ඉල්ලුම හමුවේ ජල සම්පාදනය ඉතා අභියෝගාත්මක වී ඇත. එබැවින් අනෙකුත් රටවල් සේ ම ශ්‍රී ලංකාව ද තිරසාර ජල කළමනාකරණ උපාය මාර්ගයක් සැකසීම සඳහා වන අභියෝගයට මුහුණ පා සිටී. ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වාරිමාර්ග අමාත්‍යාංශය සහ මහවැලි සංවර්ධන අධිකාරිය ඇතුළු රජයේ නියෝජිත ආයතන ගණනාවක් රටෙහි ජල කළමනාකරණ කාර්යයෙහි නියුතුව සිටී. මෙයින් වාරි මාර්ග අමාත්‍යාංශය සහ මහවැලි සංවර්ධන අධිකාරිය, ඍතු මත පදනම් වූ මෙහෙයුම් සැලැස්මකට අනුව වාරි කර්මාන්ත සඳහා ජල සම්පාදනය කරනු ලබන අතර, අවසාන බෙදුම් තීරණය වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කාෂිකර්ම දෙපාර්තමේන්තුව මෙන්ම ලංකා විදුලිබල මණ්ඩලයෙහි නියෝජිතයන්ගෙන් ද සැදුම්ලත් මණ්ඩලයක් මගින් සිදු කෙරේ. තිබෙන ජල ප්‍රමාණය මත වගා සැලැස්ම තීරණය වන අතර, නියමිත ඍතුවේ දී අනුමත කරන ලද හෙක්ටෙයාර ප්‍රමාණයක් පමණක් වගා කිරීම සඳහා ගොවියෝ යොමු කරනු ලැබෙති. අතිරික්ත ජලය පවතී නම් විදුලිබල ජනනයට ප්‍රමුඛතාව හිමි වේ. විවිධ විධිවිධාන යටතේ ක්‍රියාත්මක වන ආයතන රැසක් ක්‍රියාවලිය තුළදී සම්බන්ධ වන බැවින් ශ්‍රී ලංකාවේ ජල කළමනාකරණ කටයුතු සංකීර්ණ වී ඇත. ජල විදුලිබල ජනනය හා වාරි කර්මාන්ත සඳහා නිකුත් කරන ජලය පොදු භාණ්ඩයක් ලෙස සැලකෙන අතර, රජය එහි භාරකරුවා ලෙස කටයුතු කරයි. පොදු භාණ්ඩයක් ලෙස, ජලය බොහෝ පිරිසක් භාවිත කරන අතර, එය "පොදු ජන ව්‍යසන" තත්ත්වයක්, එනම් පෞද්ගලික සුභසිද්ධිය සඳහා තම අභිමතය පරිදි පරිභෝජනය කිරීම හේතුවෙන් ජලය ක්ෂයවීමක් හෝ විනාශ වීමක් හෝ සිදු වේ. එබැවින්, සම්පත් භාවිතය පිළිබඳ වගකීමක් සහිත ඒකාබද්ධ ප්‍රවේශයක් සහ මධ්‍යගත ක්‍රමයක් හැකි සෑම අවස්ථාවක ම ඇති කිරීම වැදගත් වන අතර, එමගින් ජලය පිළිබඳ අයිතිය හා භාවිතය යම් පාර්ශ්වයක් වෙත සුදුසු ලෙස පැවරිය යුතු වේ. එමෙන්ම, එම පාර්ශ්වය වෙතින් සුදුසු ගෙවුම් යාන්ත්‍රණයක් ඔස්සේ නැවත අදාළ මුදල් අයකර ගතයුතු ය. මෙම යාන්ත්‍රණය ඔස්සේ දුර්ලභ ජල සම්පත හොඳින් කළමනාකරණය වීමට අමතරව, රටෙහි සංවර්ධනයේ තිරසාරභාවයට ද දායක වේ.

……………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………

*(ලකුණු 25 යි)*

[ 4 වැනි පිටුව බලන්න.

**3.** පහත දැක්වෙන එක් එක් පාඨයෙහි ප්‍රධාන අදහස හැකිතාක් කෙටියෙන් එක් වාක්‍යයකින් දක්වා, තද කළු අකුරින් මුද්‍රිත යෙදුම්වලට විවරණ සපයන්න.

(i) නීතිය හා සදාචාරය අතර **අතිච්ඡාදනයක්** තිබේ. සදාචාරයට පටහැනි යැයි ජනතාවගේ බහුතරය විසින් සලකනු ලබන මිනීමැරුම හා සොරකම ද නීතිවිරෝධී වේ. මේ ආකාරයට නීතිය හා සදාචාරය අතර කැපී පෙනෙන සම්බන්ධතාවක් ඇති අතර ඒවා එකිනෙක වෙළී පවතී. මේ දෙකම සමාජයේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා වූ චර්යා පද්ධති වේ. නීතියෙන් හා සදාචාර ප්‍රතිපත්තිවලින් චර්යා පද්ධති නියම කෙරේ. පාර්ලිමේන්තුවෙන් සම්මත කර තිබීම සහ විනිශ්චයකරුවන්ගේ තීරණවල දක්නට ලැබීමට අමතරව සදාචාරාත්මක නිසා ද නීතිය අධිකාරියක් දරා සිටී. නීතිය සදාචාරයට අනුකූල නිසා නීති අනුගමනය කිරීමටත් ඒවා කඩ නොකිරීමටත් ජනතාව වගබලා ගනිති.

(ii) ප්‍රජාතාන්ත්‍රික සමාජයක පුද්ගලයාගේ අයිතිවාසිකම් සහ නන් වැදෑරුම් නිදහස කවරේ දැයි රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට බොහෝ විට අන්තර්ගත කරන අතර ඒවා ආරක්ෂා කිරීම ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සිදු කෙරේ. **සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම්**, යම් තැනැත්තෙකුගේ ජාතිය, ආගම, ස්ත්‍රී පුරුෂ භේදය හෝ දේශපාලන මතය හේතුවෙන් වෙනස්කමකට ලක් නොකිරීමේ අයිතිවාසිකම, භාෂණයේ හෝ නිදහසේ ඔබමොබ යාමේ අයිතිවාසිකම, වධහිංසා පැමිණවීමෙන් සහ නීති විරෝධීව අත්අඩංගුවේ තබා ගැනීමෙන් නිදහස්ව සිටීමේ අයිතිවාසිකම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ ලෝකයේ බොහෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවලින් පිළිගෙන ඇති ඉතා වැදගත් අයිතිවාසිකම් වේ.

(iii) ඉතාමත් යෝග්‍ය අන්දමට කෙටුම්පත් කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වුවත් නිවැරදි ආකල්පයක් මත ක්‍රියාවට නොනැගුවහොත් එය අකර්මණ්‍ය විය හැකි අතර **අඩුලුහුඬුකම් සහිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්** වුවත් නිවැරදි ආකල්පයක් මත ක්‍රියාවට නැගුවහොත් එයින් මනා පාලන තන්ත්‍රයක් පැන නගින නිසා, ප්‍රායෝගික වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ක්‍රියාත්මක කරන ආකල්පය මත බොහෝ දෑ රැඳී පවතී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක වූ ආවේණික දෝෂ නොව මිනිසුන්ගේ වැරදි, **ආසියාවේ නව ප්‍රජාතාන්ත්‍රික රටවල්** මුහුණපාන ප්‍රධානතම අනතුරයි.

*(ලකුණු 05 × 3 = 15 යි)*

[ 5 වැනි පිටුව බලන්න.

**4.** පහත දැක්වෙන එක් එක් පාඨය කියවා, ඒ ඇසුරින් දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක පුරප්පාඩුවක් ඇති වන බව දැනගන්නට ලැබුණු වහාම හෝ එවැනි අලුත් තනතුරක් ඇති කළ විට එම තනතුර නොපමාව පිරවීමට තමා නිර්දේශ කරන්නේ ද නැද්ද යන්න දක්වමින් ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පත්කිරීමේ බලධාරියා වෙත වාර්තා කළ යුතුය. එබඳු පුරප්පාඩුවක් වහාම පිරවීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා නිර්දේශ නොකරන්නේ නම් ඔහු ඊට හේතු දැක්විය යුතුය. එම පුරප්පාඩුව පිරවීම දෙපාර්තමේන්තු ප්‍රධානියා නිර්දේශ කරන්නේ නම් අනුමත බඳවා ගැනීමේ පරිපාටිය එම පරිපාටිය අනුව පිළියෙල කළ දැන්වීම් කෙටුම්පතකුත් සමග ඉදිරිපත් කළ යුතුය. පත්කිරීමේ බලධාරියා එම නිවේදනය ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කරවිය යුතුය. පත්කිරීමේ බලධාරියා ඉල්ලුම් පත්‍ර භාරගෙන සෑම ඉල්ලුම් පත්‍රයක් ම පරීක්ෂා කොට ඉල්ලුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කර බලා ඉල්ලුම් පත්‍ර උපලේඛනගත කොට, බඳවා ගැනීමේ පරිපාටියෙහි නියම කොට ඇති පරිදි තේරීම් මණ්ඩලයක් පත් කරවා ගනු සඳහා විධිවිධාන යෙදිය යුතුවේ. බඳවා ගැනීමේ පරිපාටියෙහි නියමිත ඕනෑම තේරීම් මණ්ඩලයක් පත්කිරීමේ බලධාරියා විසින් පත් කෙරෙනු ඇත. එබඳු තේරීම් මණ්ඩලයක් සාමාන්‍යයෙන් සභාපති ද ඇතුළුව රාජ්‍ය නිලධාරීන් වන සාමාජිකයන් පස්දෙනෙකුගෙන් සමන්විත විය යුතුය. අනුමත බඳවා ගැනීමේ පරිපාටියෙහි වෙනත් ආකාරයකට නියම කර නැත්නම් එබඳු මණ්ඩලයක යටත් පිරිසෙයින් එක් සාමාජිකයෙකුවත් පුරප්පාඩුව පවත්නා අමාත්‍යාංශයෙන් හෝ දෙපාර්තමේන්තුවෙන් පරිබාහිර වූ අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක නිලධාරියෙකු විය යුතුය.

(අ) මෙම පාඨයේ අරමුණ කුමක් ද?

.........................................................................................................................

.........................................................................................................................

.........................................................................................................................

.........................................................................................................................

.........................................................................................................................

(ආ) පුරප්පාඩු පිරවීම් ක්‍රියාවලියේ දී දෙපාර්තමේන්තු ප්‍රධානියා හා පත් කිරීමේ බලධාරියා අතර දක්නට ලැබෙන්නේ ප්‍රතිකූල සම්බන්ධතාවක් ද? නැතිනම් අනුකූල සම්බන්ධතාවක් ද?

.........................................................................................................................

.........................................................................................................................

.........................................................................................................................

.........................................................................................................................

.........................................................................................................................

(ඇ) පුරප්පාඩුව පවත්නා අමාත්‍යාංශයෙන් හෝ දෙපාර්තමේන්තුවෙන් පරිබාහිර වූ අමාත්‍යාංශයකින් හෝ දෙපාර්තමේන්තුවකින් නිලධාරියෙකු පත් කළ යුතු වන්නේ කෙබඳු අවස්ථාවක දී ද?

.........................................................................................................................

.........................................................................................................................

.........................................................................................................................

.........................................................................................................................

.........................................................................................................................

(ඈ) පුරප්පාඩු වූ තනතුරක් පිරවීමේදී දෙපාර්තමේන්තු ප්‍රධානියා හා පත් කිරීමේ බලධාරියා විසින් අනුගමනය කළ යුතු කාර්යයන් වෙන් වශයෙන් දක්වන්න.

.........................................................................................................................

.........................................................................................................................

[ 6 වැනි පිටුව බලන්න.

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

(උ) දෙපාර්තමේන්තුවක තනතුරක් පිරවීම අවශ්‍ය වන්නේ කෙබඳු අවස්ථාවල දී ද?

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

*(ලකුණු 02 × 5 = 10 යි)*

(ii) ශ්‍රී ලංකාව ඉහළ මැදි ආදායම් තත්ත්වයට ගමන් කරන බැවින් නිෂ්පාදන කටයුතු, ඉහළ එකතු කළ අගය සහිත නිෂ්පාදන බවට විවිධාංගීකරණය කිරීම සඳහා නවෝත්පාදන සහ පර්යේෂණ හා සංවර්ධන කටයුතු කෙරෙහි දැඩි අවධානයක් යොමු කිරීමේ අවශ්‍යතාවක් පවතී. වැටුප් ඉහළ යාමත් සමග ආර්ථිකයේ ශ්‍රම සූක්ෂ්ම කර්මාන්තවලට හිමි සාපේක්ෂ වාසිය අහිමි වන අතර, ඒ අනුව දැනට පවතින ශ්‍රම සූක්ෂ්ම කර්මාන්තවල සිට දැනුම පදනම් කරගත් තාක්ෂණ සූක්ෂ්ම කර්මාන්ත වෙත පරිවර්තනය කිරීම අවශ්‍ය වේ. මෙමගින් කාර්මික නිෂ්පාදන, ඉහළ එකතු කළ අගය සහිත නිෂ්පාදන බවට විවිධාංගීකරණය කිරීමේ හැකියාව ඇති, රටට සැලකිය යුතු මට්ටමේ විදේශ විනිමය උපදවනු ලබන නැනෝ තාක්ෂණය යොදාගත් නිෂ්පාදන, ජෛව තාක්ෂණ නිෂ්පාදන, විදුලි නිෂ්පාදන හා ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන වැනි උසස් තාක්ෂණික නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාව මතු කරයි. රජය විසින් කර්මාන්ත ක්ෂේත්‍රයේ නවෝත්පාදන ධෛර්යවත් කිරීමේ අරමුණ ඇතිව, පර්යේෂණ හා සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා මෑත වසරවලදී විවිධ දිරිගැන්වීම් ලබා දී ඇත. ආදායම් බදු අනුපාත අඩුකිරීම, පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා දරනු ලබන පිරිවැය සඳහා වන බදු අඩු කිරීම්, විද්‍යාත්මක පර්යේෂණ සඳහා භාවිත කරනු ලබන උපකරණ හා මෙවලම් සඳහා වන රේගු බදු ඉවත් කිරීම, පර්යේෂණ දීමනා හා පර්යේෂණ සඳහා අරමුදල් ලබාදීම වැනි විවිධාකාරයෙන් මෙම දිරිගැන්වීම් සිදු කරන ලදී.

(අ) මෙම පාඨයේ අරමුණ පැහැදිලි කරන්න.

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

(ආ) පර්යේෂණ හා සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය සඳහා රජය විසින් මෑත කාලීනව ලබා දී ඇති දිරිගැන්වීම් මොනවා ද?

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

(ඉ) ප්‍රවර්ධනය කළ යුතු උසස් තාක්ෂණික නිෂ්පාදන වශයෙන් මෙහි හැඳින්වෙන්නේ කවර අංශ ද?

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

(ඊ) ආර්ථිකයේ ශ්‍රම සූක්ෂ්ම කර්මාන්තවලට හිමි සාපේක්ෂ වාසිය අහිමි වීම සපුරා ගැනීම සඳහා මෙහි යෝජිත උපාය මාර්ගය කුමක් ද?

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

(උ) නිෂ්පාදන කටයුතු, ඉහළ එකතු කළ අගය සහිත නිෂ්පාදන බවට විවිධාංගීකරණය කළ යුතු වන්නේ ඇයි?

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

*(ලකුණු 02 × 5 = 10 යි)*

(iii) ආර්ථිකයේ ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතින අංශයන්ගෙන් එකක් වන සංචාරක කර්මාන්තයට 2016 වසරේ දී මිලියන 2.5 ක සංචාරක පැමිණීමේ ඉලක්කය සපුරා ගැනීම සඳහා වෙළෙඳපොළ අරමුණු කර ගත් පැහැදිලි උපාය මාර්ගයක් පැවැතීම අවශ්‍ය වේ. ගැටුම් නිමවීමත් සමග මෙම කාලපරිච්ඡේදය තුළ දී සංචාරක පැමිණීම් දෙගුණයකටත් වඩා වැඩිවීම මගින් සංචාරක කර්මාන්තයේ පවතින ශීඝ්‍ර දියුණුව පෙන්නුම් කෙරේ. කෙසේ වුවද, සංචාරක කර්මාන්තය තවදුරටත් පුළුල් කිරීමේ දී, මනා පුහුණුවක් ලද සේවක මණ්ඩලයක අවශ්‍යතාව, සේවා සැපයීමේ ප්‍රමිතිය වැඩි දියුණු කිරීම, හෝටල් කාමර ප්‍රමාණය වැඩි කිරීම සහ විශේෂයෙන් ම සාම්ප්‍රදායික නොවන වෙළෙඳපොළ වෙත සිදු කරනු ලබන ප්‍රවර්ධන වැඩසටහන් කෙරෙහි වැඩි පරිශ්‍රමයක් යොමු කිරීම වැනි නොයෙකුත් අභියෝගයන්ට මුහුණදීමට සිදු වේ. ආගන්තුක සත්කාරය පිළිබඳ පුහුණුවක් ලද සේවක සංඛ්‍යාව, දියුණුවෙමින් පවතින මෙම ක්ෂේත්‍රයේ අවශ්‍යතාව සඳහා ප්‍රමාණවත් නොවේ. එම නිසා, නව පුහුණු කිරීමේ පාසල් ස්ථාපිත කිරීමේ, උසස් සුදුසුකම් ලබා ගැනීම සහ විවිධ අංශයන්ගෙන් කුසලතා සංවර්ධනය කිරීම සඳහා වර්තමාන ශ්‍රමිකයින් උනන්දු කිරීමේ සහ වෙනත් රටවල සේවය කරන්නා වූ ශ්‍රී ලාංකේය හෝටල්කරුවන් මෙරටට පැමිණීම සඳහා දිරිගැන්වීමේ ඉහළ අවශ්‍යතාවක් පවතී. මෙය පුහුණු ශ්‍රමිකයන් ප්‍රමාණය වැඩි කිරීමටත් එමගින් මෙම ක්ෂේත්‍රයේ සේවා සැපයීමේ ප්‍රමිතිය වැඩි දියුණු වීමටත් හේතුවනු ඇත. හෝටල් ක්ෂේත්‍රයේ දැනට සිදු කෙරෙමින් පවතින මහා පරිමාණ ව්‍යාපෘතීන් මගින් ඉලක්කගත සංචාරක පැමිණීම් ප්‍රමාණයට අවශ්‍ය වන පරිදි ක්ෂේත්‍රයේ ධාරිතාව වැඩි කිරීමට හැකිවනු ඇති අතර එම නිසා මෙම ව්‍යාපෘතීන් නියමිත කාලයේ දී සම්පූර්ණ කිරීම වැදගත් වේ. මෙම ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනය සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සහයෝගී ක්‍රියාකාරිත්වය අඛණ්ඩව පවත්වා ගැනීම අවශ්‍ය වනු ඇත.

(අ) සංචාරක කර්මාන්තය තවදුරටත් පුළුල් කිරීමේ දී අවධානය යොමු කළ යුතු මූලික කරුණු කවරේ ද?

....................................................................................................

....................................................................................................

[ 8 වැනි පිටුව බලන්න.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

(ආ) ඉලක්කගත සංචාරක පැමිණීම් ප්‍රමාණයට අවශ්‍ය පරිදි ක්ෂේත්‍ර ධාරිතාව වැඩි කිරීමට යෙදිය හැකි උපාය මාර්ගය කුමක් ද?

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

(ඉ) පුහුණු ශ්‍රමිකයන් ප්‍රමාණය වැඩි කිරීමටත් අදාළ ක්ෂේත්‍රයේ සේවා සැපයීමේ ප්‍රමිතිය වැඩි දියුණු වීමටත් මෙහි යෝජිත උපාය මාර්ග කවරේ ද?

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

(ඊ) මුහුණදීමට සිදු වන අභියෝග වශයෙන් මෙහි අවධානය යොමු කෙරෙන්නේ කවර අංශ කෙරෙහි ද?

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

(උ) වෙළෙඳපොළ අරමුණු කර ගත් පැහැදිලි උපාය මාර්ගයක් පැවතීම සංචාරක ව්‍යාපාරයට අවශ්‍ය බව මේ ලේඛකයා අවධාරණය කරන්නේ ඇයි?

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

*(ලකුණු 02 × 5 = 10 යි)*

* * *